Edited with the trial version of
Foxit Advanced PDF Editor
To remove this notice, visit:
www.foxitsoftware.com/shopping

2021

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය

இலங்கைத் தேசிய பொறியியல் ஆராய்ச்சி மற்றும் அபிவிருத்தி நிலையம்

NATIONAL ENGINEERING RESEARCH & DEVELOPMENT CENTRE OF SRI LANKA



අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்ச
Ministry of Education

පටුන

1. පනත්, නීති හා ව්‍යවස්ථාපිත පාලනය ---------- 01
2. දැක්ම, මෙහෙවර, අභිමතාර්ථ, අරමුණු සහ ආයතනික වටිනාකම් ---------- 02-04
3. අධ්‍යක්ෂ මණ්ඩලය සහ සංවිධාන ව්‍යුහය ---------- 05-06
4. අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය---------- 07
5. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහ විධායක කාර්ය මණ්ඩලය ---------- 08-11
6. මානව සම්පත් කළමනාකරණය ---------- 12-16
7. 2021 වර්ෂයේ කාර්යසාධනය පිළිබිඹු කිරීම ---------- 17-25
8. 2021 වර්ෂයේ ආයතනය ලබාගත් සම්මාන හා ජයග්‍රහණ ---------- 26-27
9. 2021 වර්ෂයේ මධ්‍යස්ථානයේ මූල්‍ය සමාලෝචනය ---------- 28-44
    - 9.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
    - 9.2 2021.12.31 දිනට තත්ත්ව ප්‍රකාශය
    - 9.3 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් වර්ගීකරණය කාර්ය පදනම මත විදහාපෑම
    - 9.4 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය
    - 9.5 2021.12.31 දිනෙන් අවසන් වර්ෂයට ශුද්ධ වත්කම්/ ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය
    - 9.6 පූර්ව වර්ෂ ගැලපීම්
    - 9.7 2021.12.31 දිනට ගිණුම්කරන සටහන්
10. 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව---------- 45-51
11. විගණකාධිපති වාර්තාවේ දක්වා ඇති කරුණු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල පැහැදිළි කිරීම් 52-54



1.

පනත්, නීති හා ව්‍යවස්ථාපිත පාලනය

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ ප්‍රතිපාදන අනුව දේශීය කර්මාන්ත, තාක්ෂණ හා පර්යේෂණ ක්ෂේත්‍රයන්හි දියුණුව හා ප්‍රගමනය උදෙසා ව්‍යවස්ථාපිත පනතේ අරමුණු පෙරදැරිව 1974 වර්ෂයේදී ජා ඇල, ඒකල, කාර්මික ජනපදය තුළ පිහිටුවන ලදි. 2021 වර්ෂයේ නිපුණතා සංවර්ධන පර්යේෂණ සහ නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය යටතේ මෙම ආයතනය ක්‍රියාත්මක විය.

කාර්යාලීය ලිපිනය

2සී/17බී, කාර්මික ජනපදය
ඒකල, ජා ඇල.
ශ්‍රී ලංකා

+ 94-011-2236284
+ 94-011-2236384
+ 94-011-2236307
+ 94-011-5354597

+ 94-011-2233153

nerdcentre@nerdc.lk

නිල බැංකුකරුවෝ

- ලංකා බැංකුව , ජා ඇල
- ලංකා බැංකුව, ආයතනික ශාඛාව

විගණකවරු

- විගණකාධිපති
- විගණකාධිපති දෙපාර්තමේන්තුව



2.
දැක්ම, මෙහෙවර, අභිමතාර්ථ සහ ආයතනික වටිනාකම්

දැක්ම

"දකුණු ආසියාවේ
ප්‍රමුඛතම
ඉංජිනේරු පර්යේෂණ
සහ
සංවර්ධන මධ්‍යස්ථානය
බවට පත්වීම"

මෙහෙවර

"නව නිපැයුම් සහ ආයතනයේ
කාර්ය මණ්ඩලය මෙන්ම
ආයතනය පිළිබඳ උනන්දුවක් දක්වන
සියළු පාර්ශවයන්ගේ නිර්මාණශීලීත්වය
ප්‍රවර්ධනය වන සංස්කෘතියක්
ආයතනය තුල ඇති කරමින්
ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා
සෘජුව බලපෑමක් කළහැකි ඉංජිනේරු පර්යේෂණ
හා සංවර්ධන කටයුතු සිදුකරමින්
ඉංජිනේරු තාක්ෂණයන් සංවර්ධනය,
අත්පත් කරගැනීම,
භාවිතා කිරීම හා පැවරීම"

අභිමතාර්ථය

"ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික
සංවර්ධනය සඳහා වන
ඉංජිනේරුමය
මැදිහත්වීම."

අරමුණු

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ ප්‍රතිපාදන අනුව 1974 අගොස්තු 14 වන දින පහත සඳහන් අරමුණු පෙරදැරිව පිහිටුවා ඇත.

1. ශ්‍රී ලංකාවේ නව සොයාගැනීම් සහ නිර්මාණ කුසලතාවන්ට ධෛර්ය දීමෙන්ද, ඒවායේ සංවර්ධනයට ආධාර දීමෙන්ද, දේශීය තාක්ෂණය සංවර්ධනය සඳහා අවශ්‍ය ආයතනික ක්‍රම ඇති කිරීම සඳහා විධිවිධාන සැලසීම.

2. සාමූහික ප්‍රයත්නයන් ඵලදායී අයුරින් රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ විවිධ කර්මාන්තයන්හි සහ ආයතනයන්හි තාක්ෂණික ශිල්පීය ඉංජිනේරු සහ පර්යේෂණ කුසලතාවයන් ඒකාබද්ධ කිරීම පිණිස පහසුකම් සැළසීම.

3. රටේ සම්පත් දායාදයන්ට සහ ජාතික ක්‍රම සම්පාදනයේ අරමුණු වලට අනුකූල වන තාක්ෂණික ශිල්පීය ක්‍රම උපයුක්ත කිරීමට සහ ඒවා යොදා ගැනීමට වගබලා ගැනීම

4. අවශ්‍ය වූ විට ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි උචිත ආයතනයන්ට සෘජු ආකාරයෙන් සහ වක්‍ර ආකාරයෙන් තාක්ෂණික ශිල්පීය ක්‍රම මාරු කිරීමේ උපක්‍රම පරීක්ෂා කිරීම සහ ඒ ආයතනයන්ට උපදෙස් දීම.

5. උචිත තාක්ෂණික ශිල්පීය ක්‍රම වැඩිදියුණු කිරීමෙන් රටේ මානුෂික හා ද්‍රව්‍යමය සම්පත් වලින් විශේෂයෙන්ම ශ්‍රම සහ අමුද්‍රව්‍ය සම්පත් වලින් උපරිම උපයෝජනය අත්කර ගැනීමට අනුබල දීම.

6. කාර්මික, වාණිජ සහ වෙනත් අරමුණු සඳහා යන්ත්‍ර භාවිතා කරන්නන් විසින් ඉල්ලුම් කරනු ලැබූවිට ආදර්ශ යන්ත්‍ර සහ නියමු යන්ත්‍රාගාර අරපිරිමැස්මෙන් යුක්තව සැලසුම් කිරීම, නිෂ්පාදනය කිරීම සහ පරීක්ෂා කර බැලීම.

7. ඉංජිනේරු ශිල්පීය සැලසුම් පර්යේෂණ පිළිබඳ තාක්ෂණික දත්තයන් සහ ලේඛණාගතය ජාත්‍යාන්තර හා ජාතික නියෝජිත ආයතනයන්ගේ සහයෝගයෙන් යුක්තව අඛණ්ඩව සමීක්ෂණය කිරීම සඳහා කටයුතු පිළියෙල කිරීම.

8. රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි ව්‍යවසායනයට අබන්ධ උපදේශක සේවාවන් සැලසීම, රටෙහි ඉංජිනේරු සහ කාර්මික සැළසුම් පදනම මෙන්ම පර්යේෂණ හැකියාවන් පුළුල් කිරීම සඳහා පර්යේෂණ කටයුතු භාර ගැනීම සහ පුහුණු කිරීමේ කටයුතු වැඩිදියුණු කිරීම.

9. ඉහත කී කරුණු වලට අදාළ ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සහ සම්බන්ධ කාර්යයන් සඳහා විධිවිධාන සැලැස්වීම.

ආයතනික වටිනාකම්

සමාජීය යහපැවැත්මට දායක වන ගුණාත්මක නිෂ්පාදන, තාක්ෂණයන් සහ සේවාවන් සැපයීම සඳහා නර්ඩ ආයතනයේ අපි කැපවී සිටිමු. අපගේ ආයතනික හා වෘත්තීය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉහළ ආචාර ධර්ම ප්‍රමිතීන් අත්‍යවශ්‍ය බව අපි විශ්වාස කරමු. එනිසා, ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධනයෙහි විශිෂ්ටත්වය ළඟා කර ගැනීම සඳහා නිර්මාණය කර ඇති ඉහළ කාර්යසාධන සංස්කෘතියක්, අපගේ කාර්යමණ්ඩලය, ගනුදෙනුකරුවන්, අනෙකුත් පාර්ශවකරුවන් සහ ප්‍රජාව කෙරෙහි නර්ඩ ආයතනය කැපවීමේ මූලික වටිනාකම් වනුයේ,



අපගේ ගණුදෙනුකරුවන්

- පාරිභෝගික තෘප්තිය සඳහා වූ ගුණාත්මක හා කාලානුරූපී වූ නිෂ්පාදන, තාක්ෂණය සහ සේවාවන් සැපයීම
- ශක්තිමත් අන්තර් සබඳතාවන් පවත්වාගැනීම
- පාරිභෝගික ගෞරවය, ආචාරශීලීත්වය සහ සාධාරණත්වය

පාර්ශවකරුවන් හා ප්‍රජාව

- තිරසාර සංවර්ධනය
- සමාජීය වගකීම් දැරීම
- අගයන් එකතුකිරීම සඳහා කැපවීම

අපගේ කාර්ය මණ්ඩලය

- නිර්මාණශීලීත්වය, නවතාවය සහ විවෘතභාවය
- අඛණ්ඩ අධ්‍යනය හා සංවර්ධනය තුළින් වෘත්තීය ඉලක්ක සාධනය කිරීම
- ධනාත්මක කණ්ඩායම් හැඟීමෙන් ක්‍රියාකිරීම
- ඉහළ කාර්යසාධනය සහ ඉගෙනුම් සංස්කෘතිය
- වෘත්තීයභාවය, විවෘතභාවය සහ වගවීම

3.
අධ්‍යක්ෂ මණ්ඩලය
සහ
සංවිධාන ව්‍යුහය

සභාපති



මාහාචාර්ය ලීලානන්ද රාජපක්ෂ මහතා
PhD, MEng, BScEng., E Eng, FIMechE, MASHRAE, MIIAR, MIESL

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්



මහාචාර්ය. රාහුල අත්තලගේ මහතා
PhD, MEng., Degree of Profound Studies (DEA)
BScEng. (Hons)




කේ.ඒ.එස්.එස්.කේ. පෙරේරා මහතා
MBA, PGDip, BA(Hons)



ඉංජී. කපිල දොඩම්ගොඩ මහතා
MA Economics, FCMA, Fellow CMA (Aus.), CGMA, BScEng., AMIE(SL), MCIM, MSLIM



රිස්මින් රාසික් මහතා
MBA, BSc., FCMA(UK)


ශ්‍රී ලංකා ජාතික ඉඩිමෙන්රු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
සංවිධාන ව්‍යුහය (අනුමත බැඳවගැනීම් පරිපාටිය අනුව)
සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය
අධ්‍යක්ෂ ජනරාල්
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පළාත)
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ සහ සංවර්ධන)
අධ්‍යක්ෂ ආර්ථික විද්‍යාව
අධ්‍යක්ෂ පාංශු විද්‍යාව
අධ්‍යක්ෂ බෝග විද්‍යාව
අධ්‍යක්ෂ ඵලදායී තාක්ෂණික ඇලේඩි ඉදිරිපත්කිරීම්
අධ්‍යක්ෂ සම්පත්
අධ්‍යක්ෂ මූල්‍ය
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
ඉංජිනේරු කාර්යාලය
පාලක කළමනාකරු
අභ්‍යන්තර විගණක
පරිපාලන නිලධාරි
සැපයුම් නිලධාරි
සහකාර අධ්‍යක්ෂ (අලෙවි)
පාලක (කෘෂිකාර්මික උපදේශක)
පාලක (කෘෂිකාර්මික උපදේශක)
අලෙවි නිලධාරි
තාක්ෂණ නිලධාරි
ගෘහ නිර්මාණ ශිල්පී
ඉංජිනේරු (තාක්ෂණික)
පාලක (තාක්ෂණික)
පාලක (ඉංජිනේරු)
තාක්ෂණ නිලධාරි
පුස්තකාලයාධිපති
තාක්ෂණ නිලධාරි
රසායන ශිල්පීන්
කාර්මික සහකාර, සැළසුම්ශිල්පී, ප්‍රධාන කාර්මික ශිල්පී, පොත් කබන්නා
කළමනාකරණ සහකාර (තාක්ෂණික), කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන), කළමනාකරණ සහකාර (ඉදිරි අයකැම්/ ප්‍රදර්ශන/ පරීක්ෂණ ශාලා)
ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලය (ශිල්පීය/ අර්ධ ශිල්පීය/ ශිල්පීය නොවන)
පර්යේෂණ විද්‍යාර්ථී
පර්යේෂණ විද්‍යාර්ථී
ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු/ විද්‍යාඥ
පර්යේෂණ ඉංජිනේරු/ විද්‍යාඥ
පර්යේෂණ ඉංජිනේරු/ විද්‍යාඥ



4.
අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

2021 වාර්ෂික වාර්තාව සඳහා ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන (නර්ඩ්) මධ්‍යස්ථානයේ කාර්ය සාධනය ඉදිරිපත් කිරීමට ලැබීම මා හට ඉමහත් සතුටකි.

රටේ ප්‍රමුඛතම ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය ලෙස නර්ඩ් මධ්‍යස්ථානය විවිධ පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති, නියමු ව්‍යාපෘති, කර්මාන්ත සඳහා තාක්ෂණික සහ ඉංජිනේරු සේවා, සංවර්ධනය කරන ලද නර්ඩ් තාක්ෂණයන් පැවරීම සහ තාක්ෂණ හුවමාරුව, ප්‍රචලිත කිරීමේ ක්‍රියාකාරකම් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම් හරහා 2021 වර්ෂයේදී ද දැයට අඛණ්ඩව සේවයක් ලබාදීමට හැකි විය.

2021 වසර තුළ සතුටුදායක ලෙස නිම කරන ලද පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘතිවලින් සමහරක් ලෙස COVID ආසාදිතයින් සඳහා ඔක්සිජන් සාන්ද්‍රණයක් සංවර්ධනය කිරීම, මුහුණ හඳුනාගෙන පැමිණීම් ලියාපදිංචි කිරීමේ ස්වයික්‍රීය පද්ධතිය, කොම්පෝස්ට් නිෂ්පාදනය සහ සැකසීම සඳහා යන්ත්‍රෝපකරණ හඳුන්වාදීම යනාදිය පෙන්වා දිය හැක. ජාතික වශයෙන් වැදගත් වන පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති සිදු කිරීම සඳහා නර්ඩ් මධ්‍යස්ථානය බාහිර සංවිධාන/ ආයතනය සමඟ සහයෝගිතා කිහිපයක් ද ඇතිකරගත් අතර බහුදින ධීවර බෝට්ටු සඳහා සහ එළවළු කල් තබාගැනීම සඳහා ශීතකරණ පද්ධතියක් සංවර්ධනය පෙන්වා දිය හැක.

2021 වර්ෂයේ සිදු කරන ලද සියලුම ක්‍රියාකාරකම් සාර්ථකව දියත් කිරීම සඳහා නර්ඩ් මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් සහ සමස්ත කාර්ය මණ්ඩලයයෙන් ලැබුණු පිටුවහල ඉමහත් ය.

මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මණ්ඩලයට සහ රෙබීය අමාත්‍යාංශයේ නිලධාරීන්ට මගේ කෘතඥතාව පළ කිරීමටද මෙය අවස්ථාවක් කර ගනිමි.

ඉංජි. ඩී ඩී ආනන්ද නාමල්
අධ්‍යක්ෂ ජනරාල්



5. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහ විධායක කාර්ය මණ්ඩලය

අධ්‍යක්ෂ ජනරාල්

ඉංජි. ඩී ඩී ආනන්ද නාමල් මහතා
MEng. (Energy Technology), BSc Eng. (Hon), CEng., MIE (SL)

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ සහ සංවර්ධන)

ඉංජි. ජේ ඒ ඒ ඩී ජයසූරිය මහතා
MEng., BScEng., MIE(SL)

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සේවා)

ඉංජි. ඒ ඒ එස් පී ජයසිංහ මහතා
MBA, BScEng.(Hons), CEng., MIE(SL)

පර්යේෂණ විද්‍යාර්ථී

ඉංජි. එන් ජී ඩී විජේසිරිවර්ධන මිය
MEng., CEng., FIE (SL),

ඉංජි. ඩබ්ලිව් කේ ආර් පීරිස් මහතා
MA (Buddhist Stud), BScEng., CEng. MIE(SL)

ඉංජි. ඊ.ඒ.එන්.කේ. එදිරිසිංහ මහතා
MPhil, BScEng., MIE (SL)

ඉංජි. කේ ටී ජයසිංහ මහතා
MEng., BScEng., C Eng., MIE(SL)

ඉංජිනේරු සහ අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය දෙපාර්තමේන්තු වශයෙන්

සිවිල් ඉංජිනේරු දෙපර්තමේන්තුව

අධ්‍යක්ෂ (තාක්ෂණික)
ඉංජි. ජේ.ඒ.සී. ක්‍රිෂාන්ති මිය
M Eng., BSc Eng.,C Eng., MIE (SL)

පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. අයි.පී. බටුවිට මයා
MEng, BSc Eng., AMIE(SL)

ඉංජි. ඒ.එන්.එස්. අමරදාස මයා
BSc Eng., AMIE(SL)

ඉංජි. එච්.සී. එගොඩගමගේ මෙනවිය
BSc Eng., AMIE(SL) (2021.03.01 දක්වා)

ඉංජිනේරු
කේ ඒ එස් එස් වීරසිංහ මිය
Special Apprentice (Civil Eng.), IESL (Part I)

කෘෂි ඉංජිනේරු සහ යන්ත්‍ර සංවර්ධන දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ (තාක්ෂණික)
ඉංජි. කේ වයි එච් ඩී ශාන්ත මයා
MScEng., BSc Eng., AMIE(SL)

ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. ඒ.ජේ.ජී.එස්. දහනායක
BSc Eng., C Eng., MIE(SL)

ආචාර්ය ඒ.පී.ඩී. ලියනගේ මයා
PhD, MSc, BSc

ප්‍රධාන පර්යේෂණ විද්‍යාඥ

ආචාර්ය ඩී.එම්.සී.සී. ගුණතිලක මයා
PhD, MSc, BSc (up to 05.04.2021)

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු

ආචාර්ය ටී.එන්. ප්‍රනාන්දු මෙනවිය
PhD, B.Tech, AMIE (SL)

පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. කේ සිවසුදන් මයා
BSc Eng., AMIE (SL)

බලශක්ති සහ පාරිසරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව

වැ.බ. දෙපාර්මේන්තු ප්‍රධානී
ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු

ඉංජි. එන්.එස්.එම්.ඩී.කේ. නානායක්කාර මයා
MEng., PG Dip, BScEng, AMI(SL)

ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. එච්.එම්.එල්.යූ. හේරත් මයා
BScEng., AMIE(SL)

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු
ආචාර්ය. එස්.එම්. පතිරණ මිය
PhD, MSc, BSc, AMIE(SL)

පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. පී.එෆ්.එස්. පෙරේරා මයා
BSc Eng., M Eng., AMIE(SL)

ඉංජිනේරු
ඩබ්.ඒ.එල්.එස්. කරුණාවර්ධන මයා
HNDE

විදුලි හා විද්‍යුත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු / දෙපාර්මේන්තු ප්‍රධානී
එන් එස් කේ සමරසිංහ මයා
MSc, BSc Eng., AMIE (SL)

ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. යූ.සී. බොතේජු මයා
BScEng. CEng., MIE (SL)

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු
.ඒ.එම්.එස්.කේ. හේමසිරි මයා
MSc. BScEng.

පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. ඩී.ආර්.එස්.කේ. විමලරත්න මිය
B Tech. (Hon), AMIE(SL)

ඉංජි. වයි.එස්.පී. වීරසිංහ මයා
B Tech. AMIE (SL)

ඉංජි. එච්.කේ.අයි.එස්. ලක්මාල් මයා
BScEng., AMIE(SL)

මෙකට්‍රොනික්ස් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

ප්‍රධාන පර්යේෂණ විද්‍යාඥ/ දෙපාර්තමේන්තු ප්‍රධානී
ආචාර්ය ටී.ඒ සුරංග අනුරුද්ධ මයා
PhD, MSc. BSc(IT)

ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. එච්.පී.එච්. කුමාර මයා
MSc Eng., EC(UK) PART I & II, AMIE(SL)

ඉංජි. ඩබ්.එම්.එස්.පී.කේ. වනසිංහ මයා
BTech., AMIE (SL)

ඉංජි. අයි.ඩී.එම්.එච්. ජයන්ත මිය
BSc Eng., AMIE (SL)

SPTF Project

ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. ඒ.ආර්.සී. සල්ගාදු මයා
BScEng., AMIE(SL)

පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. සුරේශ් පී පෙරේරා මයා
CEng(UK), MIMechE(UK), NDT, AMIE (SL)

පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. එස්.එම්.එස්. සේනාරත්න මයා
MScEng.,B Tech, AMIS(SL)

බලශක්ති හා පාරිසරික කළමනාකරණ දෙපාර්තමේන්තුව

පර්යේෂණ ඉංජිනේරු / දෙපාර්තමේන්තු ප්‍රධානී
ඉංජි. ටී කේ ගීගනගේ මයා
M Sc, BSc Eng., AMIE (SL)

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. එන් පී ටී පෙරේරා මිය
MSc, BScEng.(Hons.), AMIE(SL)

ඉංජි. ඒ ජී එම් ටී සිරිවර්ධන මිය
MSc, MEng., BScEng., AMIE(SL)

පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. එම් ඩි සහර්දීන් මයා
BSc Eng., AMIE(SL)

ඉංජි.. කේ පී ඩී ඩී ජයසේකර
BSc Eng.(Hons), AMIE(SL)

ඉංජි.. ජී.එස්.ආර්. කොස්තා මිය
MEng, BScEng., AMIE (SL)

ඉංජි. එච්.ඒ.කේ. හපුආරච්චි මයා
BScEng., AMIE(SL)

ඉංජිනේරු
එච්.ඩී.සී. හෙට්ටිආරච්චි මිය
NDT

සංවර්ධන හා ව්‍යාපෘති දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ (තාක්ෂණික)
ඉංජි. කේ.එල්. මීදෙණිය මයා
MSc Eng., BSc Eng., C Eng., MIE(SL)

ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු
ඉංජි.ඩබ්.ඩබ්.පී.කේ. පෙරේරා මයා
M Eng., BSc Eng. (Hons), C Eng., MIE (SL)

ඉංජි. එස්.ඩී.එස්.පී. සෝලංගආරච්චි මයා
MSc, BSc

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. ඩී.එම්. එක්නැලිගොඩ (2021.04.08 දක්වා)
BSc, AMIESL

ඉංජි. ඩී.ඒ.ඩී.එස්. ප්‍රේමදාස මයා
MBA, BSc, AMIE(SL)

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විද්‍යාඥ (ගෘහ නිර්මාණ)
බී.ඩී.ආර්. වාමිකා මිය
MSc, BSc. Chartered Architect AIA (SL)

ඉංජිනේරු
ඉංජි. ඩී.ඒ.එම්.කේ. දිගල මිය
Special Apprentice (Civil Eng.), IESL(Part I)

පී.ඒ.යූ.ඩබ්.කේ. පරණගම්පොල මයා
NDES

තාක්ෂණික අලෙවි දෙපාර්තමේන්තුව

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු / දෙපාර්තමේන්තු ප්‍රධානී
ඉංජි. පී.එම්.ඩයි.එස්. පතිරාජ මිය
MSc Eng. BSc Eng., AMIE (SL)

පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. ජේ.එක්.අයි.පී. ජයසිරි මිය
BSc Eng., AMIE(SL)

පර්යේෂණ විද්‍යාඥ
බී.ඩී.පී.එස්. රණවීර මිය
M Sc, BSc

සහකාර අධ්‍යක්ෂ - අලෙවි
පී.එන්.ඩී. පතිරණ මිය
BSc (Hons) Sp. MCIM (UK), MSLIM (SL)

තාක්ෂණික ඉන්කියුබේටර් අංශය

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. එස්.ඒ.පී. ශලින්ද සිල්වා මයා
BSc Eng., MEng., CEng., MIE (SL)

පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. එස්.එම්.වී.පී.ඩී. සේනානායක මයා
BSc Eng., AMIE(SL)

නඩත්තු ඒකකය හා මධ්‍යම වැඩහල	තාක්ෂණ උද්‍යානය සහ ඉංජිනේරු කෞතුකාගාරය
ඉංජිනේරු ඉංජි. එන්.ඒ.ඩී.ඩී.ජේ. ප්‍රසන්න මයා NDT	**පාලක - තාක්ෂණ උද්‍යානය** ඩබ්.කේ.සී.පී. වල්පොල මයා BSc **පාලක - ඉංජිකේරු කෞතුකාගාරය** ඩී.කේ. ජයවීර මිය BSc (Hons)
මානව සම්පත් දෙපාර්තමේන්තුව	**මූල්‍ය දෙපාර්තමේන්තුව**
අධ්‍යක්ෂ (මානව සම්පත්) ඩී.ඒ.එම්. මුණසිංහ මිය MBA (HRM), BSc (HRM), AM (CIPM)	**අධ්‍යක්ෂ (මූල්‍ය)** ජේ.එම්.ආර්.එස්. ජයසිංහ මයා MBA, BBA Sp. , CPFA, ICASL – Prof. Part I
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) ආර්. ගමගේ මයා MA in Sociology, MLRHRM, BA (Social Sc.) Sp.	
තොරතුරු තාක්ෂණ අංශය	
ජාල පරිපාලක බී.පී. වික්‍රමසූරිය මයා MSc, BSc (Computing & Information Systems)	**පුස්තකාලයාධිපති** ඩී.එම්.ටී.පී.කේ. දේවගිරි මිය MMSc , B A (Library Science) Sp., ASLLA
අභ්‍යන්තර විගණන අංශය	**ප්‍රසම්පාදන අංශය**
අභ්‍යන්තර විගණක බී.පී.එස්. කුමාර මයා MPM, HNDA	**සැපයුම් නිලධාරී** ආර්.එච්.ඒ. ජීවානන්ද මයා BSc (Physical Science)




6. මානව සම්පත් කළමනාකරණය

මානව සම්පත යනු ඕනෑම ආයතනයක අරමුණු සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය සාධකයකි. මධ්‍යස්ථානයේ මානව සම්පත් කළමනාකරණයේ හදුනාගෙන ඇති ප්‍රධාන ගැටලුව වන්නේ දක්ෂ පර්යේෂකයන්/ විද්‍යාඥයන් බඳවා ගැනීම සහ රඳවා ගැනීමයි. (මෙය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ පර්යේෂණ ආයතනවල පොදු කරුණකි). පර්යේෂකයන්/විද්‍යාඥයින් වැඩසටහන්කරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, ජාතික සංවර්ධනය සහ බඳවා ගැනීම් සඳහා පර්යේෂණ අයදුම්පත්, දිරිගැන්වීම්, ත්‍යාග, පිළිගැනීම්, පර්යේෂකයන්ගේ/විද්‍යාඥයින්ගේ ශක්‍යතා සංවර්ධනය යනාදී වශයෙන්, මෙම ගැටලුව විසඳීම සඳහා පුළුල් ඒකාබද්ධ උපාය මාර්ගයක් අවශ්‍ය වේ.

මධ්‍යස්ථානයේ ධාරිතාව සහ සීමාවන් තුළ, ධාරිතා සංවර්ධන අවස්ථා සැපයීම (උදා: උසස් අධ්‍යයන, පුහුණුව සහ සංවර්ධනය, ජාත්‍යන්තර නිරාවරණ ආදිය), පහසුකම් සැලසෙන පරිසරයක් නිර්මාණය කිරීම, ව්‍යක්තීය සංවර්ධනයට සහාය වීම වැනි උපාය මාර්ග ඔස්සේ පර්යේෂණ/විද්‍යාත්මක කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට සහ රඳවා ගැනීමට සියලු ක්‍රියාමාර්ග ගෙන ඇත.

2021 වර්ෂයේ මධ්‍යස්ථානයේ සමස්ථ කාර්යමණ්ඩල තොරතුරු සාරාංශය - 31.12.2021 දිනට

සේවා බාණ්ඩය	අනුමත කාර්යය මණ්ඩලය	නිත්‍ය කාර්යය මණ්ඩලය
ඉහළ කළමනාකාරීත්වය	3	3
ඉංජිනේරු/ විද්‍යාඥ	68	53
අනෙකුත් විධායක	10	7
කණිෂ්ඨ කළමණාකාර	14	9
කළමනාකරණ සහකාර (තාක්ෂණික)	25	20
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	52	51
ප්‍රාථමික - ශිල්පීය	104	84
ප්‍රථමික - අර්ධ ශිල්පීය	3	0
ප්‍රථමික - ශිල්පීය නොවන	65	35
එකතුව	344	262



6.1 කාර්යමණ්ඩල කළමනාකරණය

- **රජයේ උපදෙස් නිසා 2021 දී කිසිදු බඳවා ගැනීමක් සිදු කර නොමැත.**
- **2021 වර්ෂය තුල සේවයෙන් ඉල්ලා අස්වීම් සහ විශ්‍රාම ගැනීම්**

	නම	තනතුර	සේවා ඛාණ්ඩය	දිනය
සේවයෙන් ඉල්ලා අස්වීම්				
01	අයි. ටී. මදුරංග සිල්වා මයා	කම්කරු	PL-I	20/01/2021
02	ආචාර්ය එස් එම් පතිරණ මිය	ජ්‍යෝෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු	AR -2	31/01/2021
03	ඒ ටී ඩී රුද්‍රිගු මිය	පොත් තබන්නා	MA 2-2	13/02/2021
04	එන් එම් අයි ඩි නවරත්න මයා	තාක්ෂණික සහකාර	MA 2-2	25/02/2021
05	ජේ එම් එච් උදය බණ්ඩාර මයා	තාක්ෂණික සහකාර	MA 2-2	26/02/2021
06	ඉංජි. එච් සි එගොඩගමගේ මයා	පර්යේෂණ ඉංජිනේරු	AR -1	01/03/2021
07	කේ ඒ එස් එස් වීරසිංහ මයා	විදුලි කාර්මික	PL-3	08/03/2021
08	ආර් ගමගේ මයා	සහතාර අධ්‍යක්ෂ (මානව සම්පත්)	MM 1-1	15/03/2021
09	ආචාර්ය ඩී එම් සි සි ගුණතිලක මයා	ප්‍රධාන පර්යේෂණ විද්‍යාඥ	HM I-3	05/04/2021
10	ඉංජි. ඩී එම් එක්නැලිගොඩ මයා	ජ්‍යෝෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු	AR-1	08/04/2021
11	එච් එම් එම් ජී ඒ කේ බී මඩවලගේ මයා	සැලසුම් ශිල්පි	MA 2-2	01/04/2021
12	ජේ එම් ඒ යූ ජයසේකර මයා	විදුලි කාර්මික	PL-3	10/08/2021
13	ඩබ්ලිව් ඒ ආර් එම් පෙරේරා මයා	පෑස්සුම්කරු	PL-3	10/09/2021
14	ඩබ්ලිව් ඩබ්ලිව් කලුආරච්චි මයා	තාක්ෂණික සහකාර	MA 2-2	31/10/2021
15	ඉංජි. නේ සිවසුධන් මයා	පර්යේෂණ ඉංජිනේරු	AR -1	31/12/2021
විශ්‍රාම ගැනීම්				
01	ජේ කේ ප්‍රියන්ත පෙරේරා මයා	රියදුරු	PL-3	01/01/2021
02	එම් එල් ඒ පීරිස් මයා	ප්‍රධාන කාර්මික ශිල්පි	MA 2-2	07/01/2021
03	පී රංජිත් පෙරේරා මයා	රිය සහායක	PL-3	22/01/2021
04	ආර් අයි පී පීරිස්	කම්කරු	PL-3	27/01/2021
05	එස් ඩී ප්‍රේමජයන්ත මයා	පෑස්සුම් / වැද්දුම්කරු	PL-3	01/03/2021
06	කේ කේ ඒ සෝමරත්න මයා	කම්කරු	PL-3	21/04/2021
07	ඩබ්ලිව් උපාලි සේනාරත්න මයා	පෑස්සුම් කරු	PL-3	31/05/2021
08	ඊ එම් එස් එදිරිසූරිය මයා	කම්කරු	PL-3	13/06/2021
09	එම් එස් ජේ ප්‍රනාන්දු මයා	යන්ත්‍රශිල්පි	PL-3	24/08/2021
10	බී ජේ ඒ මෙන්ඩිස් මිය	කළමණාකාර සහකාර (තාක්ෂණික නොවන)	MA 1-2	30/11/2021
11	ඩබ්ලිව් ඒ සී ප්‍රනාන්දු මයා	කම්කරු	PL-3	05/12/2021
12	ඩබ්ලිව් සී ඒ එස් පෙරේරා මයා	කම්කරු	PL-3	31/12/2021

6.2 පුහුණුව සහ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය

නර්ඩ් මධ්‍යස්ථානයෙහි ප්‍රමුඛ වගකීම වන්නේ ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධනයන් වන බැවින් මධ්‍යස්ථානයේ මානව සම්පත් ධාරිතාවය වර්ධනය කෙරෙහි නිරන්තර අවධානය යොමු කෙරේ. ඒ අනුව කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබාගැනීම සඳහා කාර්යමණ්ඩලයේ වෘත්තීය සංවර්ධනය අරමුණු කරගත් කාර්යමණ්ඩලයේ සියලුම සේවා කාණ්ඩවල නිවැරදි ආකල්ප වලින් හෙබි දැනුම, කුසලතා සහ නිපුණතා වැඩිදියුණු කිරීමට කළමනාකාරීත්වය විසින් සියලු පියවර නිරන්තරයෙන් ගනු ලැබේ.

නමුත් කොවිඩ් 19 වසංගත තත්වය 2021 වර්ෂයේ ආයතනයේ සමස්ත පුහුණු සහ සංවර්ධන ක්‍රියාකාරකම් කෙරෙහි අහිතකර ලෙස බලපාන ලදි. කෙසේ වෙතත් ඇතැම් ධාරිතා සංවර්ධන සහ පුහුණු වැඩසටහන් මාර්ගගත ක්‍රමය ඔස්සේ සංවිධානය කරන ලද අතර ඒ සඳහා කාර්යම මණ්ඩලය යොමු කිරීමට කටයුතු කරන ලදි.

6.2.1 පශ්චාත් උපාධි /වෘත්තීය සුදුසුකම් සපුරාලීම සඳහා පහසුකම් සැලසීම

2021 වසර තුළ කරගෙන යනු ලබන පශ්චාත් උපාධි පාඨමාලාවන්				
අංකය	නම	තනතුර	පාඨමාලාව	ආයතනය
1	ඉංජි. කේ.පී.ඩී.ඩී. ජයසේකර මයා	පර්යේෂණ ඉංජිනේරු	MEng./PG Diploma in Environmental Eng. & Mgt.	මොරටු විශ්ව විද්‍යාලය
2	ඉංජි. ඒ.ජී.එම්.ටී. සිරිවර්ධන මයා	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු	PhD Studies of Engineering and Computer Sciences	Australian National University
3	ඉංජි. යූ.සී. බොතේජු මයා	ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු	MSc Eng (Control & Instrumentation)	පේරාදෙණිය විශ්වවිද්‍යාය
4	ඉංජි. අයි.ඩී.එම්.එච්. ජයන්තා මිය	පර්යේෂණ ඉංජිනේරු	MSc./PG Diploma Course in Electrical Installation	මොරටු විශ්ව විද්‍යාලය
5	ඉංජි. එච්.එම්.එස්.පී.කේ. වනසිංහ මයා	පර්යේෂණ ඉංජිනේරු	MSc./PG Diploma Course in Electrical Installation	කොළඹ විශ්වවිද්‍යාලය

6.2.2 විදේශ ශිෂ්‍යත්ව/ සම්මන්ත්‍රණ/ පුහුණු වැඩසටහන් සහභාගිවීම

2021 වසර තුල සහභාගි වූ විදේශ ශිෂ්‍යත්ව/ සම්මන්ත්‍රණ/ පුහුණු වැඩසටහන්				
අංකය	නම සහ තනතුර	පාඨමාලාව	රට	කාල සීමාව
1	ආචාර්ය ටී එන් ප්‍රනාන්දු මිය	International Conference on Material TECH 2021"	ඉන්දියාව	09.01.2021
2	වයි එස් පි වීරසිංහ මයා	Training of Trainers Programme on Data Stewardship for Open Science 2021	චීනය	16.03.2021 to 16.04.2021
3	ඩබ්ලිව් ඒ එල් එස් කරුණාවර්ධන මයා	International Workshop on Groundwater Conversation and Management by Leveraging Science, Technology and Innovation Workshop"	කෙන්යා	27.01.2021 to 28.01.2021
4	ඉංජි. එච් කේ අයි එස් ලක්මාල් මයා	Online programme on Increasing the competitive advantage of a Nation Malaysia	මැලේසියාව	27.05.2021 to 28.05.2021
5	ඉංජි. එන් එස් කේ සමරසිංහ මයා	Online Course on Deep Learning (Artificial Intelligence)	ඉන්දියාව	28.06.2021 (7 weeks)
6	ඉංජි. යු සී බොතේජු මයා	Online Course on Deep Learning (Artificial Intelligence)	ඉන්දියාව	28.06.2021 (7 weeks)
7	ඉංජි. එන් කේ අයි එස් ලක්මාල් මයා	Online Course on Deep Learning (Artificial Intelligence)	ඉන්දියාව	28.06.2021 (7 weeks)
8	ඩී ඒ එම් එස් කේ හේමසිරි මයා	online course on Deep Learning (Artificial Intelligence)	ඉන්දියාව	28.06.2021 (7 weeks)
9	ඉංජි. එන් කේ අයි එස් ලක්මාල් මයා	Hydro Energy online training - Indian Institute of Technology Roorkee - SAARC	පකිස්තානය	13.09.2021 to 17.09.2021
10	ආචාර්ය ඒ ඩි පී ලියනගේ මයා	Hydro Energy online training - Indian Institute of Technology Roorkee - SAARC	පකිස්තානය	13.09.2021 to 17.09.2021
11	ඉංජි. අයි ඩි එම් එච් ජයන්තා මිය	Hydro Energy online training - Indian Institute of Technology Roorkee - SAARC	පකිස්තානය	13.09.2021 to 17.09.2021
12	පි එන් ඩි පතිරණ මිය	Regional Workshop on Innovative Strategies for Research Commercialization and Technology Transfer, Tashkent, Uzbekistan	Uzbekistan	24.11.2021

6.2.3 අභ්‍යන්තර පුහුණු වැඩසටහන්

අංකය	පුහුණු වැඩසටහන	කාල සීමාව	කා සඳහාද	සහභාගීත්වය
1	විද්‍යුත් තැපෑල භාවිතා කිරීම පිළිබඳ වැඩමුළුව	26.11.2021	ඉංජිනේරු, විධායක ශ්‍රේණි, සහ කළමණාකරණ සහකාර (තාක්ෂණික සහ තාක්ෂණික නොවන)	50
2	අභ්‍යන්තර විගණනය සහ රසායනාගාර කළමනාකරණය පිළිබඳ	25.10.2021 & 26 .10.2021	ඉංජිනේරු,, විද්‍යාඥ, කළමණාකාරණ සහකාර	10
3	ගණිතාගාර වැඩමුළුව	22.11.2021 to 24.11.2021 & 13.12.2021 to 16.12.2021	කළමණාකාරණ සහකාර (ප්‍රදර්ශක)	04
4	විද්‍යුත් තැපෑල භාවිතා කිරීම පිළිබඳ වැඩමුළුව	26.11.2021	ඉංජිනේරු, විධායක ශ්‍රේණි, සහ කළමණාකරණ සහකාර (තාක්ෂණික සහ තාක්ෂණික නොවන)	50

6.2.4 දේශීය පුහුණු වැඩසටහන්/ වැඩමුළු/ සම්මන්ත්‍රණ/ සම්මේලන සඳහා සහභාගිවීම

අංකය	නම සහ තනතුර	පුහුණු වැඩසටහන	මෙහෙයවීම	කාල සීමාව	සහභාගීත්වය
1	එන් පී ටී පෙරේරා මිය ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු	Training Programme on Consultant Development in Water Auditing and Water Foot print Assessment.	National Cleaner Production Centre (NCPC)	09.02.2021 to 11.02.2021	01
2	එම් ඩි සහර්දීන් මයා පර්යේෂණ ඉංජිනේරු				01
3	කේ පි ඩි ඩි ජයසේකර මයා පර්යේෂණ ඉංජිනේරු				01
4	අයි පි බටුවිට මයා පර්යේෂණ ඉංජිනේරු	CPD on Finance for Engineers	Chartered Institute of Personnel Management Sri Lanka	06.02.2021	01
5	එන් පී ටී පෙරේරා මිය ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු	CPD on Plumbing Engineering Part 1	IESL	13.03.2021	01
6	එච් ඒ කේ හපුආරච්චි පර්යේෂණ ඉංජිනේරු	Training Programme on Consultant Development in ISO 50001:2018 - Energy Management System	National Cleaner Production Centre (NCPC)	29.03.2021 to 01.04.2021	02
7	එස් ආර් හෙන්ඩ්‍රික්ස් මයා තාක්ෂණික සහකාර	Aluminium Fabrication Training	IDB Training Centre	27.04.2021 to 29.04.2021	05
8	ඩබ්ලිව් කේ ඩි සම්පත් මයා තාක්ෂණික සහකාර				
9	කේ එන් ආරියරත්න මයා පෑස්සුම් / වැද්දුම්කරු				
10	ඩබ්ලිව් ජී යූ එන් කරුණාරත්න මයා පෑස්සුම් / වැද්දුම්කරු				
11	එච් ජී එස් ඉන්ද්‍රවංශ මයා පෑස්සුම්කරු				
12	කේ ආර් එන් පෙරේරා මයා පෑස්සුම්කරු				

අංකය	නම සහ තනතුර	පුහුණු වැඩසටහන	මෙහෙයවීම	කාල සීමාව	සහභාගීත්වය
13	ඉංජී. ඩී ඩී ඒ නාමල් මයා අධ්‍යක්ෂ ජනරාල්	Capacity Building Training on Conducting Life Cycle Assessment (LCA)	National Cleaner Production Centre (NCPC)	06.07.2021 to 09.07.2021	04
14	එස් ජී එම් ඩබ්ලිව් සිල්වා මයා කළමණාකරණ සහකාර	Basic Rules and Ethics to be followed when using email for official process	NIPM	29.07.2021	02
15	කේ බී එච් වී ලෙයිටන් මිය කළමණාකරණ සහකාර				
16	කේ පී ඩී ඩී ජයසේකර මයා පර්යේෂණ ඉංජිනේරු	Training Programme on IOMC Toolkit for Local Stakeholders	National Cleaner Production Centre (NCPC)	25.11.2021 & 16.12.2021	01
17	එම් ඩී සහර්දීන් මයා පර්යේෂණ ඉංජිනේරු	Training Programme on Consultant Development in Quantification of carbon Footprint	National Cleaner Production Centre (NCPC)	13.12.2021 to 17.12.2021	01
18	ඉංජී. ජේ ඒ සී ක්‍රිෂාන්ති මිය අධ්‍යක්ෂිකා (තාක්ෂණික)	Inaugural workshop for Mainstreaming Resource Efficient Housing and Construction Sri Lanka	CIDA	13.12.2021	01

6.2.5 ආධුනිකයින්/ උපාධි අපේක්ෂකයන් සඳහා කාර්මික/තාක්ෂණික පුහුණු පහසුකම් සැලසීම

විශ්වවිද්‍යාල හා පිළිගත් වෘත්තීය/ කාර්මික පුහුණු ආයතනයන් විසින් යොමු කරනු ලැබූ ආධුනිකයින් 51 දෙනෙකු සඳහා මාස 3/ මාස 6 සහ වසරක වැනි කාල පරිච්ඡේදයන්ට අදාළව වෘත්තීය/ කාර්මික පුහුණු අවස්ථාවන් 2021 වර්ෂය තුළ සලසා ඇත.



7.
2021 වසරේ කාර්යසාධනය පිළිබිඹු කිරීම

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන කටයුතු වල නියුතු තාක්ෂණික දෙපාර්තමේන්තු 05 ක්, තාක්ෂණික සේවා සපයන දෙපාර්තමේන්තු 03 ක් සහ ඊට අමතරව මූල්‍ය සහ මානව සම්පත් කළමනාකරණය සඳහා වූ දෙපාර්තමේන්තු 02 කින් ද සමන්විත වේ.

තාක්ෂණික දෙපාර්තමේන්තු මගින් සිවිල් ඉංජිනේරු, විදුලි හා විද්‍යුත් ඉංජිනේරු , මෙකාට්‍රොනික්ස් ඉංජිනේරු, බලශක්ති හා පාරිසරික ඉංජිනේරු සහ කෘෂිකර්ම හා යන්ත්‍රෝපකරණ සංවර්ධන යන ක්ෂේත්‍රයන්ට අදාළව ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කෙරේ. තාක්ෂණික අළෙවි දෙපාර්තමේන්තුව විසින් මධ්‍යස්ථානයේ වැඩිදියුණු කරන ලද තාක්ෂණයන් ප්‍රචලිත කිරීම හා සමාජගත කිරීම සිදු කෙරේ. කර්මාන්ත වෙත අවශ්‍ය තාක්ෂණික සේවාවන් වාණිජ්‍යමය වශයෙන් සැපයීම සිදු කරනු ලබන්නේ බලශක්ති හා පාරිසරික සේවා දෙපාර්තමේන්තුව විසිනි. ව්‍යාපෘති හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මධ්‍යස්ථානයේ වැඩි දියුණු කරනු ලැබූ තාක්ෂණයන් මත පදනම් වූ වාණිජ ව්‍යාපෘතීන් සිදු කරනු ලබයි. උදාහරණ ලෙස වියදම් පිරිමැසුම්දායක ගොඩනැගිලි ඉදිකිරීම්, ආදාහනාගාර ඉදිකිරීම්, ජීවවායු ජනක ස්ථාපිත කිරීම යනාදිය සඳහන් කළ හැක.


2021 වර්ෂයේදී මධ්‍යස්ථානය විසින් සිදු කරන ලද කැපී පෙනෙන පර්යේෂණ සහ සංවර්ධන කටයුතු, තාක්ෂණික සේවාවන් සහ වාණිජ ව්‍යාපෘති පිළිබඳ පහත සඳහන් කර ඇත.

7.1 ප්‍රධාන පර්යේෂණ සහ සංවර්ධන විශේෂ අවස්ථා

නිම කරන ලද පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති

ජෛව ඩීසල් බලාගාරය සැලසුම් කිරීම - රසායනාගාර පරිමාණය

ජෛව ඩීසල් ප්‍රධාන වශයෙන් භාවිතා කරන ලද පිසින තෙල් වලින් සාදා ගනු ලබන අතර එය පවතින ඩීසල් එන්ජින්වල කිසිදු වෙනස් වීමකින් තොරව භාවිතා කළ හැකි පිරිසිදු පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයකි. ශ්‍රී ලංකාව තුළ හෝටල් සහ අනෙකුත් ආහාර ආශ්‍රිත කර්මාන්තවලින් වරක් භාවිතා කර ඉවතලන තෙල් සැලකිය යුතු ප්‍රමාණයක් පවතී. එහෙත් අවසානාවකට මෙන්, මෙම භාවිතා කරන ලද පිසින ලද තෙල් සමහර ආහාර නිෂ්පාදකයින් විසින් ඔවුන්ගේ ආහාර නිෂ්පාදන සඳහා නීති විරෝධී ලෙස භාවිතා කරනු ලබන අතර, පාරිභෝගිකයින් මෙම සෞඛ්‍යයට අහිතකර ආහාර භාවිතයට ගැනීම නිසා අනතුරට පත්වේ. මෙම ජෛව-ඩීසල් කර්මාන්තය ශ්‍රී ලංකාවට හඳුන්වාදීමෙන් බොහෝ ප්‍රතිලාභ අත්පත් කර ගත හැකිවේ. විදේශ විනිමය ඉතිරි කර ගත හැකි වීම, පෙට්‍රෝලියම් දහනය අවම කර ගත හැකි වීම සහ වරක් භාවිතා කළ පිසින ලද තෙල් සෞඛ්‍යයට අහිතකර ලෙස නැවත භාවිතා කිරීම නැවැත්වීම අමතර වාසියක් වනු ඇත. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ ඉල්ලීමක් මත මෙම රසායනාගාර පරිමාණයේ ජෛව-ඩීසල් බලාගාරය නිර්මාණය කර ඇත. රසායනාගාර පරිමාණයේ ජෛව-ඩීසල් බලාගාරය සැලසුම් කිරීම 2021.09.30 දින නිම කරන ලද අතර සම්පූර්ණ වාර්තාව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය වෙත භාර දෙන ලදී.



රසායනාගාර පරිමාණයේ ජෛව ඩීසල් බලාගාරය

අමුද්‍රව්‍ය ලෙස ඉරිඟු ශාක අපද්‍රව්‍ය වලින් ලබාගත් සෙලියුලෝස් තන්තු භාවිතා කරමින් සෙවිලි තහඩු නිෂ්පාදනය


මෙම පර්යේෂණ ව්‍යාපෘතිය සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව සමග සාර්ථකව නිම කරන ලද ලද්දකි. මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ ඇස්බස්ටස් තහඩු වෙනුවට විකල්ප සෙවිලි තහඩුවක් නිෂ්පාදනය කිරීමයි. හෂ්මීය හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් **(AHP)** පෙර සකසන ලද ඉරිගු තන්තු සාමාන්‍ය පෝට්ලන්ඩ් සිමෙන්ති සමග එක්කොට මෙම මිශ්‍රණය ශක්තිමත් කිරීමක් සිදු කෙරේ. පවතින හෂ්මීය හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් පූර්ව ක්‍රියාදාමය වැඩිදියුණු කර කාර්මික වශයෙන් විශාල ශාකමය තන්තු ප්‍රමාණයක් කෙටි කාල සීමාවකදි අඩු පිරිවැයකින් වෙන් කර ගැනීමට යොදා ගනී.

මෙයට අමතරව, තහඩුවල තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා පොලි වයිනයිල් ඇල්කොහොල් (PVA) සහ පොලිප්‍රොපිලීන් ද ශක්තිමත් කිරීමේ ද්‍රව්‍ය ලෙස භාවිතා කරයි. මෙම සංවර්ධිත සෙවිලි තහඩුව ශ්‍රී ලංකා ප්‍රමිතීන්ට අනුව සාමාන්‍ය කොන්ක්‍රීට් මිශ්‍ර සෙවිලි තහඩුවල පවතින සාමාන්‍ය ජල අවශෝෂණය 17.09%ක් වූ අතර සාමාන්‍ය නම්‍ය බර 0.6kN ක පවතී.





ලෝහ අච්චුව මත තවරන ලද පූර්ව ක්‍රියාදාමයට ලක් කරන ලද බඩ ඉරිඟු තන්තු



(**a**) තෙත් සහ (**b**) වියලා සකස් කරන ලද සෙවිලි තහඩු

තේ කර්මාන්තයේ තාපය ලබාගැනීම සඳහා දර කැබලි භාවිතා කිරීම

මෙම තාක්ෂණය සංවර්ධනය කරන ලද අතර එහි ප්‍රතිඵල නර්ඩ් පර්යේෂණ සම්මන්ත්‍රණයේදී පර්යේෂණ පත්‍රිකාවක් මගින් ප්‍රචලිත කරන ලදී. මේ සඳහා උපරිම තෙතමනය 25%ක් සහිත (තෙත්) දර කැබලි භාවිතා කල හැකිය. තේ කර්මාන්ත ශාලා සඳහා මෙම තාක්ෂණය ක්‍රියානිරූපණය කිරීම සහ කාර්යක්ෂමතාව තක්සේරු කිරීම රටතුල පැවැති වසංගත තත්ත්වය තුළ සිදු කිරීමට නොහැකි විය.

මෙම ව්‍යාපෘතිය තේ පර්යේෂණ ආයතනය හා සම්බන්ධ වී සිදුකරන ලද අතර යන්ත්‍රයේ ක්ෂේත්‍ර පරීක්ෂාව පැල්මඩුල්ල රිල්හේන තේ කාර්මාන්ත ශාලාවේදී සිදුකරන ලදි.




- **එකවර කිලෝ 100ක ධාරිතාවයකින් යුත් උම්බලකඩ ප්‍රමාණයක් වියලා ගත හැකි විජලකයක් සංවර්ධනය කිරීම**

ශ්‍රී ලංකාව තුළ දකුණු වෙරළබඩ ප්‍රදේශයේ උම්බලකඩ නිෂ්පාදනය සඳහා මත්ස්‍ය සැකසුම් තාක්ෂණය වැඩිදියුණු කිරීම සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන ආයතනය දරණ ප්‍රයත්නයට සහාය දැක්වීම සඳහා නර්ඩ් ආයතනය ගත් තීරණයකට අනුව මෙම පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

නර්ඩ් ආයතනය විසින් මෙම වියලන යන්ත්‍රය නිර්මාණය කර, නිමැවුම්කර ධීවර ප්‍රජාව සිටින ස්ථානයක ඉදිකර ඇත්තේ නාරා ආයතනය මගින් ලබා දී ඇති ක්‍රියාවලි නියමයන්, තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් සහ මෙම වියලන යන්ත්‍රය පාවිච්චි කරන්නාගේ ආර්ථික ප්‍රතිලාභ සැලකිල්ලට ගනිමින්ය.

නර්ඩ් ආයතනය විසින් කෝට්ටගොඩ, දික්වැල්ලහි මෙම වියලනය සැලසුම්කොට, නිෂ්පාදනය කර, ඉදිකිරීම් කටයුතු සිදු කර ඇති අතර 2022 වර්ෂයේ මුල් භාගයේදී නාරා ආයතනය සහ නර්ඩ් ආයතනය මගින් මෙම විජලකයේ පරීක්ෂා කිරීම් කටයුතු සිදු කිරීමට නියමිතව ඇත.



- **ඉදිකිරීම් කර්මාන්තය තුල බිත්ති ඉදිකිරීම සඳහා පිරිමැසුම්දායක සැහැල්ලු බ්ලොක්ගලක් වැඩිදියුණු කිරීම**

සැහැල්ලු බිත්ති මෑතකදී ඉදිකිරීම් ක්ෂේත්‍රය තුල බෙහෙවින් අවශ්‍ය වූ අංගයකි. විවිධ සංවර්ධිත අමුද්‍රව්‍ය භාවිතා කිරීමෙන් බිත්ති ඉදිකිරීම සඳහා විවිධ වර්ගයේ බ්ලොක්ගල් නිෂ්පාදනය කරනු ලැබේ. මේවා අතර සැහැල්ලු මෙන්ම විවිධ නිර්මාණ සහිත බ්ලොක්ගල් ප්‍රධාන ස්ථානයක් ගනී.

සැහැල්ලු බ්ලොක්ගල් භාවිතා කිරීමෙන්, ගොඩනැගිල්ලේ බර දරා ගන්නා ව්‍යුහාත්මක ඉදිකිරීම් සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය අඩුවීමෙන් ඉදිකිරීම් පිරිවැය අඩුකර ගත හැකි වේ. ගොඩනැගිල්ලේ බර දර ගැනීම සඳහා මෙම බ්ලොක්ගල් භාවිත කළ නොහැක.



සැහැල්ලු බ්ලොක් ගල් භාවිතයෙන් ඉදිකරන ලද බිත්තියක්



සැහැල්ලු බ්ලොක්ගල් සහිත කැටයම් කරන ලද පැනලයක්

ස්වයංක්‍රීයව ක්‍රියාකරන බිත්ති පින්තාරු කිරීමේ උපකරණය සැලසුම් කිරීම සහ සැකසීම

ස්වයංක්‍රීයව බිත්ති පින්තාරු කිරීම සඳහා නිපදවන මෙම යන්ත්‍රයේ සවිකර ඇති වායු රහිත ඉසිනය සිරස් අතට චලනය වන අතර පොළොව මත තිරස් අතට ගමන් කරනු ලබයි. උපකරණයේ ආකෘතිය සහ සැලසුම්පත් පිළියෙල කර ඇත. උපකරණය සැකසීම සඳහා අවශ්‍ය උපාංග මිලදී ගෙන ඇති අතර පාලන පද්ධතිය සඳහා අවශ්‍ය උපාංග එකලස් කර ඇත. මෙම ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු 2022 වසරේ සිදු කෙරෙනු ඇත.



නිපදවන ලද ස්වයංක්‍රීය බිත්ති පින්තාරු කිරීමේ උපකරණය

ඔක්සිජන් සාන්ද්‍රකය වැඩිදියුණු කිරීම



රෝගීන් හට ඔක්ෂිජන් වායුව කෘත්‍රිමව ලබාදීම සඳහා භාවිතා වන Oxygen Concentrator උපකරණය දේශීයව නිෂ්පාදනය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

ධාරිතාවය මිනිත්තුවකට ලීටර් 5 හා 10 ප්‍රමාණයේ ඔක්ෂිජන් සාංද්‍රණය කිරීමේ උපකරණය සැලසුම් කර ආයතනය තුල පරීක්ෂා කරන ලදි. කොම්ප්‍රෙසරය සහ ඔක්ෂිජන් සාන්ද්‍රණය කිරීමේ අමුද්‍රව්‍ය (Zeolite) පමණක් ආනයනය කරන ලද අතර පාලක පද්ධතිය ආයතනය මගින් නිර්මාණය කරන ලදි.

ISO නිර්දේශිත තත්ත්වයට අනුව යන්ත්‍රයේ දැරීමේ හැකියාව හා ක්‍රියාකාරීත්වය ආයතනය තුල පරීක්ෂා කර ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතිය සඳහා ඉදිරිපත් කොට ඇත.

7.2 බලශක්ති හා පාරිසරික කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව මගින් 2021 වසරේදී සපයනු ලැබූ සේවාවන්

නර්ඩ මධ්‍යස්ථානයේ බලශක්ති හා පාරිසරික කළමණාකරණ දෙපාර්තමේන්තුව කර්මාන්ත, වාණිජ ආයතන, රාජ්‍ය ආයතන ආදියෙහි බලශක්ති පද්ධති, කාර්මික ක්‍රියාවලි සහ පාරිසරික පද්ධති අධීක්ෂණය, පාලනය, වැඩිදියුණු කිරීම සහ කළමනාකරණය කිරීම ආදිය සඳහා සම්බන්ධ වීම සහ වායු විශ්ලේෂණ, අපජලය, ශීතකරණ, විදුලි ලාම්පු, සහ මෝටර් රථ බැටරි පරීක්ෂණ පහසුකම් සපයනු ලබයි. . තවද, එම අපජලය විශ්ලේෂණය, ශබ්ද මට්ටම මැනීම, වායු විශ්ලේෂණ, විදුලි ලාම්පු පරීක්ෂාව සහ ශීතකරණ පරීක්ෂාව ISO17025:2017 යටතේ පිලිගත් රසායනාගාර තත්ත්වයන් යටතේ පවත්වනු ලබයි. ඒ අනුව, මෙම දෙපාර්තමේන්තුව මගින් 2021 වර්ෂය තුල කර්මාන්ත සඳහා එම සේවාවන් 387ක් පමණ ලබාදී රුපියල් මිලියන 16.71ක ආදායමක් උපයා ගෙන ඇත.

බලශක්ති හා පාරිසරික කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙහි ඉලක්කයන් සහ දායකත්වයන්
වර්ෂ 2021 දී භෞතික හා මූල්‍ය ඉලක්ක සහ වාණිජ ක්‍රියාකාරකම්වල දායකත්වයන් පිලිබඳ සාරාංශය

ව්‍යාපෘතිය / ක්‍රියාකාරකම	භෞතික (සේවා සංඛ්‍යාව)		මූල්‍යමය (රුපියල් මිලියන)					
			ආදායම			දායකත්වය		
	අපේක්ෂිත ඉලක්කය	අවසන් කර ඇති ව්‍යාපෘති	අපේක්ෂිත (රුපියල්)	ලැබූ (රුපියල්)	ඉලක්ක අභිභවා ලද (%)	ඉලක්කය (රුපියල්)	ලැබූ (රුපියල්)	ඉලක්ක අභිභවා (%)
කර්මාන්ත සඳහා සපයන ලද සේවා	952	367	30,500	14,258	46.75	22,000	5,438	24.71
කර්මාන්ත සඳහා රසායනාගාර පරීක්ෂණ	275	164	5,500	2,456	44.65	3,500	703	20.09
පුහුණු වැඩසටහන්	2	0	100	0	0	30	0	0
Total	**1229**	**531**	**36,100**	**16,714**	**46.30**	**25,530**	**6,141**	**24.05**

කර්මාන්ත සඳහා සපයනු ලබන සේවාවන්

කර්මාන්ත සඳහා වන සේවාවන් මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වාණිජ ක්‍රියාකාරකම් වන අතර, විවිධ කර්මාන්ත සඳහා ඔවුන්ගේ ඉල්ලීම පරිදි පහත සඳහන් සේවාවන් සපයනු ලබයි.

- බොයිලේරු විශ්ලේෂණය, සුසර කිරීම සහ කාර්යක්ෂමතා පරීක්ෂණය
- කර්මාන්ත ක්‍රියාවලීන් අධීක්ෂණය කිරීම
- ශබ්ද පාලන පද්ධති සැලසුම් කිරීම සහ සම්මත මිනුම් වාර්තා ලබා දීම
- වායු අංශු පාලන උපදෙස් සහ සම්මත මිනුම් වාර්තාවන් ලබාදීම
- ශබ්ද සහ වායු තත්ත්ව පාලනය කිරීමේ සේවා සහ ඒවායේ තත්ත්ව අධීක්ෂණ සේවා
- ප්‍රමිතීන් මත පදනම්ව ස්ථානීය ප්‍රභවයන්හි විමෝචක වායු පරීක්ෂා කිරීම
- OSHA ප්‍රමිතිය මත පදනම්ව කර්මාන්ත ඇතුලත වායු තත්ව අධීක්ෂණය

2021 වසරේ කර්මාන්ත සේවා සැපයීම් සඳහා ඉලක්ක ගත ආදායම සහ ලබාගත් ආදායම පිලිවෙලින් රුපියල් මිලියන 30.5ක් සහ රුපියල් මිලියන 14.2ක් විය.

විවිධ ක්‍රියාකාරකම් වලින් සිදු කරන ලද සේවාවන් පහතින් දක්වා ඇත.

ක්‍රියාකාරකම	සේවා සංඛ්‍යාව
බොයිලේරුවල තත්ත්වය සහ විමෝචක වායු පරීක්ෂාව	130
අදාල නියමයන්ට අනුව ශබ්ද මට්ටම් මැනීම	99
අදාල නියමයන්ට අනුව අවට වායුවේ ගුණාත්මකභාවය නිරීක්ෂණය කිරීම	63
කර්මාන්තවල පාරිසරික ගැටළු පාලනය කිරීම සඳහා විසඳුම් ලබා දීම	31
කර්මාන්ත ක්‍රියාවලි අධීක්ෂණ සේවා	36
උපකරණ ක්‍රමාංකනය සහ පරීක්ෂා කිරීම - ශබ්ද මිනුම් මීටරය - ලක්ස් මීටරය	 04 23
බලශක්ති විගණන	01


විවිධ රසායනාගාර පරීක්ෂණයන්

සේවාව	සේවා සංඛ්‍යාව
අපජල සාම්පල පරීක්ෂා කිරීම	83
විදුලි ලාම්පු පරීක්ෂාව	66
ශීතකරණ යන්ත්‍ර පරීක්ෂාව	07
විදුලි කෝෂ (බැටරි) පරීක්ෂාව	08

7.3 සංවර්ධන සහ ව්‍යාපෘති දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලද වාණිජමය කටයුතු

අංකය	වාණිජමය කටයුතු	මුළු වටිනාකම (රුපියල් මිලියන)
01	සිවිල් ඉංජිනේරු උපදේශාත්මක සේවා සැපයීම	10.65
02	පිරිමැසුම්දායක ගොඩනැගිලි සහ අනෙකුත් ව්‍යුහයන් ඉදිකිරීම	38.60
03	කොන්ක්‍රීට් නිෂ්පාදන අලෙවි කිරීම	7.75
04	භාණ්ඩ නිෂ්පාදනය කිරීම, සැපයීම, ආදාහනාගාර ඉදිකිරීම සහ කාලීනව සිදු කෙරෙන සේවා සැපයීම, යන්ත්‍ර නිපදවීම, සවි කිරීම වැඩි දියුණු කිරීම්	7.76

කොළඹ විශ්වවිද්‍යාලීය, දේශීය වෛද්‍ය ආයතනය සඳහා දේශන ශාලාව සහ ආපන ශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම









මිල්කෝ ආයතනයේ ගබඩා සංකීර්ණයේ අලුත්වැඩියා කිරීම - පොළොන්නරුව



මීටර් 9 x මීටර් 2.1 මොරටියන ඇල හරහා පෙරසවි කොන්ක්‍රීට් අඩිපාලම ඉදිකිරීම - හීන්පන්දල උතුර, පාරගොඩ

7.4 තාක්ෂණික අලෙවි දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබූ සේවාවන්

2021 වසරේ සිදු කරනු ලැබූ තාක්ෂණ ප්‍රවර්ධන වැඩසටහන්

	ක්‍රියාකාරකම	**ප්‍රමාණය**
01	ව්‍යවසායකයින් සඳහා නව නර්ඩ තාක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම්	20
02	බලපත්‍ර අලුත් කිරීම්	80
03	දැනුවත් කිරීමේ වැඩසටහන්	18
04	පුහුණු වැඩසටහන්	03

තාක්ෂණික අලෙවි දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබූ තාක්ෂණ ප්‍රවලිත කිරීමේ වැඩසටහන්

	ක්‍රියාකාරකම	**ප්‍රමාණය**
01	ඉලෙක්ට්‍රොනික සහ මුද්‍රිත	02
02	පුවත් පත් සහ සඟරා සඳහා පුවත්පත් ලිපි	10
03	නර්ඩ පුවත්පත් ලිපි	06
04	සමාජ මාධ්‍ය ක්‍රියාකාරකම්	06

පේටන්ට් බලපත්‍ර ක්‍රියාවලින්

පේටන්ට් බලපත්‍ර ගොනු කිරීම්

අංකය	පේටන්ට් බලපත්‍රය
01	අරීය වාත ප්‍රවාහයන් මගින් ක්‍රියාත්මක වන විජලකය
02	ස්වයංක්‍රිය නැවුම්කිරි එකතුකරන භාජන සේදීමේ යන්ත්‍රය
03	අඩු බලශක්ති පිරිවැයකින් ඉවතලන බඩඉරිගු කොපු හා උක් යුෂ ගෙන ඉවත දමන අපද්‍රව්‍ය මගින් සෝඩියම් කාබොක්සි මෙතිල් සෙලියුලෝස් නැමති රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය කරන ක්‍රියා පිළිවෙල
04	බස් රථය මගීන්ගෙන් පිරුණු ප්‍රමාණය දක්වන උපකරණය
05	පස් ආශ්‍රිත ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදන යොදා සකසන ලද පාරිසරික සංයුක්ත මිශ්‍රණයක් සෑදීමේ ක්‍රියාදාමය

පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම්

අංකය	පේටන්ට් බලපත්‍රය
1	මෝටර් රථ සේවා ස්ථානවල අපජලය පිරිපහදු කිරීම සඳහා වූ සංයුක්ත පද්ධතිය
2	පොල් සඳහා පොහොර යෙදීමේ යන්ත්‍රය
3	පාදයෙන් ක්‍රියාකරණ කෘතිම අත
4	ඉපිලුමක් මගින් වාරිමාර්ගවල එසවුම් ගේට්ටු පහසුවෙන් ක්‍රියාත්මක කිරීම සඳහා එසවුම් යාන්ත්‍රණයක්
5	ස්ලිප්ෆෝම් තාක්ෂණය උපයෝගි කර ගනිමින් බිත්ති ඉදිකිරීමේ යාන්ත්‍රණය
6	දුම් මාළු සැකසීමේ ඒකකය

තාක්ෂණ උද්‍යානයේ සහ ඉංජිනේරු කෞතුකාගාරයේ ක්‍රියාකාරකම්

	ක්‍රියාකාරකම්	ප්‍රමාණය
01	තාක්ෂණ උද්‍යානය සහ ඉංජිනේරු කෞතුකාගාරයට නරඹන්නන්	327
02	විශේෂ අධ්‍යාපන වැඩසටහන්	12

7.5 සංවර්ධන හා ව්‍යාපෘති දෙපාර්තමේන්තුවෙන් සපයනු ලබන සේවා

සංවර්ධන සහ ව්‍යාපෘති දෙපාර්තමේන්තුව මගින් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනයන් ඇතුළු පුද්ගලිකව ද නර්ඩ සංවර්ධිත තාක්ෂණයන් සහ උපදේශන සේවා සැපයීම් කරනු ලැබේ.

සංවර්ධන සහ ව්‍යාපෘති දෙපාර්තමේන්තුව සාමාන්‍ය වශයෙන් පිරිමැසුම්දායක ගොඩනැගිලි තාක්ෂණය, අඩිපාලම් ඉදිකිරීම්, පැති බැමි ඉදිකිරීම, ආදාහනාගාර, අපද්‍රව්‍ය දාහක, ජීවවායු ජනක ඉදිකිරීම්, සැලසුම් සහ උපදේශන සේවා ඇතුළු යන්ත්‍ර නිෂ්පාදනය ඇතුළු නර්ඩ සංවර්ධිත තාක්ෂණයන් සඳහා වූ කාර්යයන් ද භාර ගනු ලබයි.

මීට අමතරව, මධ්‍යස්ථානයේ යටිතල ව්‍යුහය සහ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ කිරීම් සහ නඩත්තු කටයුතුද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. සංවර්ධන සහ ව්‍යාපෘති දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබූ සේවාවන්,

	ක්‍රියාකාරකම	ව්‍යාපෘති සංඛ්‍යාව	ආදායම රු. මිලියන
1	සිවිල් ඉංජිනේරු උපදේශන සේවා සැපයීම්	04	10.65
2	පිරිමැසුම්දායක ගොඩනැගි සහ ව්‍යුහයන් ඉදිකිරීම්	03	25.5
3	පෙරනිමි සහ පෙරසවි කොන්ක්‍රීට් උපාංග අලෙවිය	01	2.4
4	භාණ්ඩ නිෂ්පාදන හා සැපයීම්, ආදාහනාගාර සැකසීම්, ස්ථාපනය, ඉදිකිරීම්, අලුත්වැඩියා කිරීම් සහ වැඩිදියුණු කිරීම්	15	7.765
5.	නර්ඩ මධ්‍යස්ථානයේ ගොඩනැගිලි සහ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණ කිරීම්	10	6.025
6.	නර්ඩ මධ්‍යස්ථානයේ නඩත්තු කටයුතු		



8.

2021 වර්ෂය තුළ ලබාගත් සම්මාන හා ජයග්‍රහණ

හොඳම වාර්ෂික වාර්තාව සහ ගිණුම් සඳහා වූ සම්මානය

ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය විසින් පිරිනමනු ලබන **ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ (පර්යේෂණ ආයතන) 2019 වර්ෂයේ හොඳම වාර්ෂික වාර්තාව සහ ගිණුම් සඳහා වූ රජත සම්මානය** 2023 ඔක්තෝබර් 25 වන දින නර්ඩ් මධ්‍යස්ථානය වෙත හිමි විය.


CA
APFA
Association of Public Finance Accountants of
Sri Lanka (APFASL)
The Public Sector Wing of CA Sri Lanka
Awards for
Best Annual Reports and Accounts – 2019
In the Public Sector (Research Institutions)
SILVER AWARD
National Engineering Research & Development-
Centre of Sri Lanka (NERD)
29th December 2021
Colombo
V.Kanagasabapathy
PRESIDENT, APFASL
Asela Athapathu
SECRETARY, APFASL


CA
THE INSTITUTE OF
CHARTERED ACCOUNTANTS OF SRI LANKA
INCORPORATED BY ACT NO.23 OF 1959
APFA
ASSOCIATION OF
PUBLIC FINANCE ACCOUNTANTS OF SRI LANKA
(Public Sector Wing of CA Sri Lanka)
Best Annual Reports and Accounts Awards
for Public Sector - 2019
Public Sector - Research Institutions Category
SILVER AWARD
AWARDED TO
National Engineering Research & Development-
Centre of Sri Lanka (NERD)
On 29th December 2021 in Colombo
By The
Association of Public Finance Accountants of
Sri Lanka (APFASL),the Public Sector Wing of
CA Sri Lanka
V. Kanagasabapathy
PRESIDENT, APFASL
Asela Athapathu
SECRETARY, APFASL
ASSOCIATION OF PUBLIC FINANCE ACCOUNTANTS OF SRI LANKA



9

2021 වර්ෂයේ මධ්‍යස්ථානයේ මූල්‍ය සමාලෝචනය

9.1 මූලික ගිණුම් ප්‍රතිපත්ති

1.1 පිළියෙල කිරීමේ පදනම

මෙහි සමන්විත මූල්‍ය ප්‍රකාශන මත මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ ප්‍රකාශය,ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සාදා ඇත්තේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුකූලවය.

සමාලෝචිත වර්ෂය ලෙස සලකා ඇත්තේ 2021.01.01. සිට 2021.12.31 කාල පරිච්ඡේදය.

මෙම මූල්‍ය ප්‍රකාශන 2021 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා වේ.

1.2 අගය කරලීම හා ගිණුම්ගත කරන පදනම

මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ ප්‍රකාශය,ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිලියෙල කර ඇත්තේ අඛණ්ඩ පැවැත්ම හා ඓතිහාසික පිරිවැය සංකල්ප මත පදනම්වය.

1.3 ගණුදෙණු ක්‍රියාත්මක වූ හා ඉදිරිපත් කරන මූල්‍ය ඒකකය

මෙම මූල්‍ය ප්‍රකාශයන්හි පිළිබිඹු වන ගණුදෙණු සිදු කර ඇත්තේ හා ඉදිරිපත් කර ඇත්තේ මෙම මධ්‍යස්ථානය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයෙහි භාවිතා වන මූල්‍ය ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි. එසේ නොවන අවස්ථාවකදී ඒ පිළිබඳ වෙනම දක්වා ඇත.

1.4 සංසන්දනාත්මක තොරතුරු

සංසන්දනාත්මක කාලසීමාවන් සඳහා වන මූල්‍ය ප්‍රකාශනය 2020 ජනවාරි සිට 2020 දෙසැම්බර් 31 දක්වා මාස 12 ක කාල සීමාවක් සඳහා ප්‍රතිඵල ඇතුළත් වේ. මෙහිදී මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය,ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා ගිණුම්කරණ සටහන් ප්‍රවර්ථන කාලපරිච්ඡේදය හා සැසඳිය හැකි වනු ඇත.

පිටු අංක 39-41 හි දක්වා ඇති පරිදි පූර්ව වර්ෂ ගැලපීම් වල බලපෑමට නතුව සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇති අතර, එසේ එම බලපෑම මත වෙනස්කම් සිදුකරනු ලැබුවා වූ සංසන්දනාත්මක තොරතුරු " නැවත ප්‍රතිස්ථාපිත " ලෙස නම්කර ඇත.

1.5 සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චය කරලීම, ඇස්තමේන්තු හා උපකල්පනයන්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුව මූල්‍ය ප්‍රකාශන හා සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්ති, වත්කම්, වගකීම්, ආදායම්, අසම්භව්‍ය වගකීම් හඳුනාගැනීම් සම්බන්ධයෙන් කළමණාකරණ විනිශ්චය කරලීම් ඇස්තමේන්තුගත කරලීම හා උපකල්පනයන් භාවිතා කර ඇත. කෙසේ නමුත් උපකල්පනයන් හා ඇස්තමේන්තු සම්බන්ධයෙන් වන අවිනිශ්චිතතාවයන් මත ඉදිරිපත් කරන ලද වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක ගැලපීම් ඉදිරි කාලපරිච්ඡේදයක සිදු විය හැක. මෙහිදී මධ්‍යස්ථානයේ ඉදිරි අනාගත අඛණ්ඩ පැවැත්ම හා සම්පත් ප්‍රමාණාත්මකභාවය පිළිබඳව කළමණාකාරිත්වය නිසි ඇගයීමක පිහිටා ඇත. තවදුරටත් මධ්‍යස්ථානයේ පැවැත්ම පිළිබඳව බලපාන අවිනිශ්චිත තත්ත්වයක් හෝ සැකයක් කළමණාකාරිත්වය වෙත නොමැත. මෙනිසා මූල්‍ය ප්‍රකාශ සාදා ඇත්තේ අඛණ්ඩ පැවැත්ම යන පදනම මතය.

02. දේපල, පිරියත හා උපකරණ

2.1 හඳුනාගැනීම හා මැනීම

පිරියත ලෙස ගෙන ඇත්තේ සෘජුව මිළදී ගැනීම් සඳහා අදාල වන වියදම්ය. මධ්‍යස්ථානය විසින්ම ගොඩ නංවා ගනු ලැබූ වත්කම්වල පිරිවැය ලෙස ඒවායේ අභිලාෂගත අරමුණු ඉටුවන මට්ටම දක්වා දරණ ලද අමුද්‍රව්‍ය, සෘජු ශ්‍රමය හා අනෙකුත් සෘජුව හඳුනාගත හැකි වියදම් පිරිවැය ලෙස සලකනු ඇත. ප්‍රාග්ධන ප්‍රතිසංස්කරණ ගොඩනැංවීම් වලදී ගොඩනැගිලි ඉවත්කරලීම් පිරිවැය හා අදාල පරිදි ණය පොලී පිරිවැය ප්‍රාග්ධනිත කරනු ඇත. යම් ප්‍රාග්ධන භාණ්ඩයක අත්‍යාවශ්‍ය අංගයක් ලෙස මෘදුකාංග පවතින විට එම මෘදුකාංග පිරිවැය අදාල භෞතික උපකරණය සමඟම ප්‍රාග්ධනිත කෙරේ. ප්‍රාග්ධන භාණ්ඩවල අනුයුක්ත කොටස් සඳහා වෙන වෙනම වූ ඵලදායී ජීවිත කාලයක් ඇති අවස්ථාවකදි එම භාණ්ඩයන් වෙන වෙනම හඳුනා ගැනේ. ස්ථාවර වත්කම් බැහැර කරලීමේ දී ජනිත වන ලාභ හෝ අලාභ හඳුනා ගැනෙන්නේ එම වත්කමේ විකුණුම් මිල හා පොත්වල ඇති ශුද්ධ අගය සැසඳීමෙනි. මෙම උපලබ්ධි ලාභය/අලාභය අමතර ආදායම් හෝ අමතර වියදම් ලෙස හඳුනා ගැනේ. ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් හරලන අවස්ථාව වන විටදී ඒ හා අදාල අගයක් ප්‍රත්‍යාගණන සංචිතය තුල පවතින්නේ නම් එය ඉදිරියට ගෙනා රදවාගත් ඉපැයුම් ශේෂය සමඟ ගැළපේ.

2.2 ප්‍රත්‍යාගණනය

මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කිරීම සඳහා දේපල හා පිරියත සමගාමීව ප්‍රත්‍යාගණනය කරනුයේ එකම කාණ්ඩයට අයත් වත්කම් තෝරාගෙන වටිනාකම හා දින අතර ඇති වෙනස ඉවත් කිරීමටය.

වත්කම් කාණ්ඩවල ප්‍රත්‍යාගණනය පෙරෙලෙන පදනමක් යටතේ ප්‍රත්‍යාගණනය කරනුයේ වත්කම් කාණ්ඩ වල අගය සුලු කාලයක් ඇතුලතදී යාවත්කාලීන කිරීමටය.

දේපල හා පිරියත වල සාධාරණ අගය සාමාන්‍යයෙන් නිර්ණය කරන්නේ වෙළඳ අගය පදනම් කරගෙනය. වත්කම් වල ඇගයීම සිදු කරනු ලබන්නේ අගයන් පිළිබඳ වෘත්තීමය දැනුමක් ඇති කණ්ඩායමක් විසිනි. වත්කම් වැඩි ප්‍රමාණයක සාධාරණ අගය ගනු ලබන්නේ වෙළඳපොලේ සඳහන් මිල අනුවය.

ප්‍රත්‍යාගණනය කිරීමේදී වත්කම් කාණ්ඩ වල අගයෙහි වැඩිවීමක් ලැබූ විට එය ප්‍රත්‍යාගණන අතිරික්තයක් ලෙස පෙන්වයි. කෙසේ වෙතත් ඌනතාවයක් පෙන්නුම් කරන අවස්ථාවේදී අතිරික්තය සමතුලිත වන සේ ඌනතාවය කපා හැරේ. ප්‍රත්‍යාගණන අතිරික්තය එකම කාණ්ඩයක් යටතේ ඇති වත්කම් වලින් කපා හැරීම මිස වෙනත් කාණ්ඩයක ඇති අතිරික්ත වලින් කපා හැරීම සිදු නොකෙරේ.

2.3 ක්ෂය කරලීම

වත්කම් ක්ෂය කරලීම වත්කම් වල පිරිවැයෙන් සුන්බුන් අගය අඩු කරලීමෙන් අනතුරුව එන අගය මත පදනම් වනු ඇත. යම් වත්කමක් සංයුතියෙහි ඇති ප්‍රමාණාත්මක වැදගත් අංශයන්හි ප්‍රයෝජනවත් ජීවිත කාලය විවිධ වන අවස්ථාවලදී ඒවා වෙන වෙනම ක්ෂය කරලීමට භාජනය කරනු ඇත. වත්කම් වල ක්ෂය ඒවායේ ඇස්තමේන්තුගත ජීවිත කාලය තුළ ලාභාලාභ ගිණුමෙහි පෙන්වනු ඇත. සලකා බලන වර්ෂයේදී හා පසුගිය වර්ෂයේදී මෙම ඇස්තමේන්තුගත අනුපාතයන් පහත පරිදිය.

වත්කම් කාණ්ඩය	ක්ෂය%
ඉඩම් - සටහන අංක 1	
ගොඩනැගිලි	2.5
කාර්යාල උපකරණ	15
උපකරණ	15
ප්‍රදර්ශන භාණ්ඩ	15
පරිසණක යන්ත්‍ර	331/3
රථ වාහන	15
ලී බඩු උපකරණ	10
යන්ත්‍රෝපකරණ සහ විද්‍යාගාර පහසුකම්	15
පුස්තකාල පොත්	05
යටිතල පහසුකම්	15
මෘදුකාංග	33 1/3

ඉඩම් (සටහන අංක 1)

වසර 50 ක කුලී පදනම මත 2028 අගෝස්තු 13 දින දක්වා ගිවිසුම් ගත කාල සීමාවකට අක්කර 9, රූඩ් 3 පර්චර්ස් 19ක භූමි ප්‍රමාණයක් සන්තකය.

2.4 පොත්වලින් ඉවත්කරලීම

වත්කමක ගෙන යන අගය පොත්වලින් ඉවත්කරලීම එහි අනාගත ඇස්තමේන්තුගත ප්‍රතිලාභ නොමැති විටදී හෝ එය ඉවත් කරනු ලබන විටකදී සිදු කරනු ඇත. වත්කම් බැහැර කරන අවස්ථාවකදී සිදුවන ලාභ හා පාඩු, වත්කම් වල විකුණුම් අගය හා ශුද්ධ අගය අතර වෙනස සැසඳීමෙන් ගන්නා අතර එය මෙහෙයුම් වාර්තාවන්හි අනෙකුත් ආදායම් යටතේ දක්වනු ඇත.

2.5 අස්පෘශ්‍ය වත්කම්

මධ්‍යස්ථානය විසින් අත්පත් කරගන්නා ලද නිශ්චිත ජීවන කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් අගය කරනු ලබන්නේ පිරිවැයෙන් ඒවායේ ක්‍රම ක්ෂය හා මුලු අගය අඩුවීම්ද ගැලපීමෙනි. අනතුරුව ලැබෙන වියදම් ප්‍රාග්ධනිත කරනු ලබන්නේ එම වියදම නිසා අදාල අස්පෘශ්‍ය වත්කමෙහි අනාගත ප්‍රතිලාභ ලැබීම වර්ධනය වන ස්වරූපයක් ඇති නම් පමණි. ක්‍රම ක්ෂය කරනු ලබන්නේ පිරිවැය හා අවශේෂ අගය අතර වෙනසය. ක්‍රම ක්ෂය අගය මෙහෙයුම් ප්‍රකාශයන්හි සරල මාර්ග ක්ෂය ක්‍රමයට අදාල අනුපාතය මත පෙන්නුම් කෙරේ. භායනය කරනු ලබන්නේ අස්පෘෂ්‍ය වත්කම මධ්‍යස්ථානයේ භාවිතයට ගත් දින සිටය. අස්පෘෂ්‍ය වත්කමෙහි ඇස්තමේන්තුගත අනුපාතයන් සමාලෝචිත වර්ෂයන් හා සංසන්දනාත්මකව පහත දී ඇත.

ස්වාධිකාරය (පේටන්ට්), වෙළඳ ලකුණ හා මෘදුකාංගය ද මේ යටතේ වර්ග කරුනු ලැබේ. මෙම පේටන්ට් ලැයිස්තුව තුළ, ලැබී ඇති පේටන්ට් බලපත්‍ර හා ක්‍රියාවලිය තුල පවතින පේටන්ට් ඉදිරිපත් කරනු ලැබේ. පේටන්ට් අයදුම්පත් ඉවත් වුවහොත් එය ආදායම් ප්‍රකාශයේ ගලපනු ලබයි. NERDC හි මූල්‍ය ප්‍රකාශනවල වටිනාකම පෙන්නුම් කළ යුතු බැවින් පේටන්ට් සඳහා දරනු ලැබූ අයදුම්පත් ගාස්තුව එහි නාමික වටිනාකම ලෙස සඳහන් කරනු ලැබේ. කෙසේ වෙතත් පේටන්ට් බලපත්‍ර නැවත තක්සේරු කිරීමේ ක්‍රියාවලිය ඉතා ඉක්මනින් සිදු නොකෙරෙනු ඇතැයි අපේක්ෂාවෙන් යුතුව අඛණ්ඩව කටයුතු කරනු ලැබේ.

- **මෘදුකාංග** - 33 1/3 % භායන වර්ෂයන් ඵලදායී ජීවිත කාලය හා අන්ත අගය සෑම කාලපරිච්ඡේදකදීම සමාලෝචනය කරනු ඇත.

3 තොග

තොග අගය කර ඇත්තේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් අවමය සලකාය. තොග පිරිවැය FIFO තොග නිකුත් කරලීමේ මූලධර්ම මත පදනම්ව ඇත. තොගයන් වර්තමාන ස්ථානයට හා තත්වයට ගෙන ඒම සඳහා දරනු ලැබූ වියදම් ඒවායේ පිරිවැය ලෙස ඇත.

රසායනාගාර තොග හා කෙරීගෙන යන වැඩ ඒවායේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන්නෙන් අඩු අගයට ගෙන ඇත.

4 ලැබිය යුතු වෙළඳ ශේෂ

අඩමාන ණය වෙන්කරලීම්

ගණුදෙනුකරුගේ විනිශ්චය, ප්‍රතිචාරය හා ගණුදෙනුවේ ස්වභාවය මත රු.313,171.36 ක වෙන් කිරීමක් පොත් අගය ලෙස ගෙන තිබේ. ඉහත කරුණු පදනම් කරගනිමින් පහත සඳහන් ප්‍රමාණය අඩමාන ණය වෙන් කිරීමක් ලෙස පුරෝකථනය කර තිබේ.

(A) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව රු. 313,171.36

5 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයන්හි මුදල් හා මුදල් සමාන දෑ ලෙස හඳුනා ගනු ලබන්නේ අතැති මුදල්, බැංකු මුදල්, තාවකාලික කැඳවුම් තැන්පතු වේ.

6 දෙන ලද ණය හා ලැබිය යුතු ගිණුම්

යම්කිසි ස්ථාවර හෝ නිශ්චිත ගෙවීම් සිදු කරන හා වෙළඳපොල තුල සංසරනය නොවන ණය දීම් මුලින්ම සාධාරණ අගය හා සෘජුව ස්ථාපනය කල හැකි වියදම් මත පදනම්ව හඳුනා ගැනෙනු ඇත.

7 මූල්‍ය වගකීම්

ව්‍යුත්පන්නයන් නොවන මූල්‍යමය වගකීම් අනෙකුත් මූල්‍යමය වගකීම් ලෙස හඳුනා ගැනේ. මෙම අනෙකුත් මූල්‍යමය වගකීම් ලෙස නියෝජනය වන්නේ වෙළඳ ගෙවිය යුතු ගිණුම් හා සම්බන්ධිත පාර්ශවයනට කල යුතු ගෙවීම්ය. මෙම වගකීම් ප්‍රථමයෙන්ම හඳුනාගනු ලබන්නේ සාධාරණ අගයට යම් සෘජුව හඳුනාගත හැකි පිරිවැය ගැලපීමෙනි. මූල්‍ය තත්ව ප්‍රකාශනයේදී මූල්‍ය වගකීම් හා මූල්‍ය වත්කම් එකිනෙකට හිලව් කර පෙන්වනු ලබන්නේ මධ්‍යස්ථානයට ඒ සඳහා නීතිමය අයිතියක් පවතින්නේ නම් පමණි.

8 සේවක ප්‍රතිලාභ වගකීම්

සේවය හැරයාමේදී ගෙවනු ලබන ප්‍රතිලාභ ව්‍යවස්ථාපිතව දක්වා ඇති පරිදි සිදු කර ඇත. සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා මධ්‍යස්ථානයේ දායකත්වය පිළිවෙලින් 15% හා 3% ක් වේ. 1983 අංක 12 දරණ පනත ප්‍රකාරව පාරිතෝෂික වෙන් කර ඇත. පාරිතෝෂික වෙන්කරලීම සඳහා මහා භාණ්ඩාගාරය මගින් ප්‍රතිපාදන සපයනු ලැබේ. මෙම පාරිතෝෂික වෙන්කරලීම පහත පරිදි ගනනය කෙරේ. (අවසන් වරට ගත් මූලික වැටුප + ජීවන වියදම් දිමනාව සහ අනෙකුත් අදාල දීමනා 1/2 x සම්පූර්ණ කර ඇති වර්ෂ ගණන)

විශ්‍රාම වයස දීර්ඝ කරලීම

2021.12.14 දින නිකුත් කරන ලද 2/2021 දරණ චක්‍රලේඛය මගින් සේවකයන්ගේ විශ්‍රාම ගන්නා වයස අවුරුදු 62 දක්වා දීර්ඝ කරන ලද බැවින් 2022 වර්ෂයේදී ජංගම වගකීම් ලෙස වෙන් කර පෙන්නා නැත.

9 වෙන්කරලීම්

මින් නියෝජනය වන්නේ අතීතයේදී ඇතිවුනු සිද්ධියක් මත මධ්‍යස්ථානය වෙත වර්තමානයේදී හඳුනාගත හැකි නීතිමය හෝ ඵලදායි ස්වරූපයේ බැඳීම් මත විශ්වාසනීයව පූර්වකථනය කරගත හැකි අනාගත මූල්‍ය පිටතට ගලා යාමය.

10 වෙන්කරලීම්, අසම්භාව්‍ය වත්කම් හා අසම්භාව්‍ය වගකීම්

ශේෂපත්‍ර දිනට මධ්‍යස්ථානය වෙත ඇති ප්‍රමාණය ඇස්තමේන්තු කර ගත හැකි, අනාගත සම්පත් පිටව යාමක් විය හැකි බැදියාවන් සඳහා වෙන් කරලීම් තබනු ඇත. අසම්භාව්‍ය වගකීම් සඳහා ශේෂ පත්‍රයේ සටහන් ලෙස දක්වා ඇත.

11 ආදායම් හඳුනා ගැනීම

යම්කිසි ආදායමක් විශ්වාසවන්තව ගණනය කලහැකි නම් හා ඊට අදාල ආර්ථික ප්‍රතිලාභය ලබා ගැනීම සඳහා මධ්‍යස්ථානය වෙත හැකියාවක් ඇති අවස්ථාවේදී ආදායම් හඳුනා ගැනේ. ලැබී ඇති හා ලැබීමට ඇති අගයන්ගේ සාධාරණ අගයට වට්ටම් හා බදු ඉවත් කරලීමෙන් ආදායම් හඳුනා ගනී. ආදායම් හඳුනා ගැනීමේදී පහත දැක්වෙන විශේෂ ලක්ෂණයන් පදනම් කරගෙන ඇත.

a) සංවර්ධිත තාක්ෂණයන් විකිණීම

අදාල තාක්ෂණයන් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මකව ප්‍රතිලාභයේ හා අවදානමේ හිමිකාරිත්වයේ අයිතිය මාරු වීම සිදුවන අවස්ථාවේදී ආදායම හඳුනා ගනී. පවරනු ලැබූ තාක්ෂණයන් සම්බන්ධයෙන් පසු කාලින කළමණාකාරිත්ව හෝ පාලන මැදිහත් වීමක් මධ්‍යස්ථානය දරණු නොලැබේ.

b) සේවා සැපයීම

සේවා ආදායම හඳුනාගනු ලබනුයේ අදාල සේවාව ජනනය වූ හෝ කරනු ලැබූ කාල පරිච්ඡේදයටය.

c) කොන්ත්‍රාත් ආදායම

කොන්ත්‍රාත්තුවක ආදායම එහි සමස්ථ ප්‍රතිඵලය විශ්වාසනීයව අගය කල නොහැකි විටකදී කර ඇති වැඩ ප්‍රතිශතය මත ලබා ගනී.

d) බදු

ව්‍යවස්ථාපිතව මධ්‍යස්ථානය ගෙවිය යුතු වන ආදායම් බදු එකතු කල අගය මත බදු, ජාතිය ගෙඩනැගීමේ බදු යනාදිය අදාල ව්‍යවස්ථාපිත ආයතනයන්ට ගෙවනු ලැබේ.

e) පොලී ආදායම

උපචිත වන අවස්ථාවේදී පොළී ආදායම හඳුනා ගනී.

f) ජංගම වත්කම් බැහැර කරලීමෙන් ජනිත වන ලාභ හා අලාභ

ජංගම නොවන වත්කම් වල විකුණුම් මිලෙන් එම වත්කම් වල ශුද්ධ පොත් අගය හා ඒවා බැහැර කරලීමට කරනු ලබන අනෙකුත් වියදම් ද අඩු කරලීමෙන් පසු ලැබෙන ප්‍රතිඵලය ආදායම ප්‍රකාශනයට ගනු ලැබේ. තවද ප්‍රමාණාත්මක වශයෙන් අඩු අගයකින් සමන්විත ජංගම නොවන වත්කම් වල ඉවත් කරලීම එකිනෙකට වෙන වෙනම නොව පොදුවේ ශුද්ධ අගය දක්වනු ලැබේ.

g) අනෙකුත් ආදායම්

අමතර ආදායම් ලෙස තාක්ෂණික පැවරුම් කටයුතු වල ශුද්ධ ලාභය, කැඳවුම් තැන්පතු හා බැදුම්කර පොලී ආදායම කාල ප්‍රමාද දඩ මුදල්, ලබා දී ඇති ණය වලට පොලී, නැවත නොගෙවන තැන්පතු, සැපයුම්කරුවන් ලියාපදිංචි කරලීම, සුළු ආදායම්, හානි වූ තොග විකුණුම්, ජංගම නොවන වත්කම් බැහැර කරලීම් ආදායම හා පොදු කාර්ය අයකර ගැනීම ආදිය ඇතුලත් වේ.

h) විලම්භීත ආදායම

රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් අත්පත් කර ගන්නා ජංගම නොවන වත්කම් වලට අදාල කෂය වෙන් කරලීම් වලින් විලම්භීත ආදායම සමන්විත වේ.

2021 වර්ෂයේ ගිණුම්වල, අනෙකුත් මූලාශ්‍රයන්ගෙන් ලද ප්‍රධානයන් මතද පිහිටා විලම්භීත අයහාර හඳුනාගන ඇත. එය පූර්ව වර්ෂ ගැලපීම මගින් විලම්භීත අයහාර ගිණුම්කරණය අනුගත කල පලමු වර්ෂය තෙක් බලපෑම ගිණුම්කරණයට නතු කර ඇත. ඒ අනුව NERD මධ්‍යස්ථානය වෙත ලද සියළුම ප්‍රාග්ධන ප්‍රදානයන් විලම්භීත අයහාර ගිණුම්කරණයට නතුකර ඇත.

12 . ප්‍රදානයන්

ප්‍රදානයන් ලෙස ආදායම් ප්‍රකාශන වල දක්වනු ලබන්නේ ලැබීම සඳහා සාධාරණ සහතික වීමක් ඇති හා ලබා ගැනීම උදෙසා මධ්‍යස්ථානය විසින් සියළුම කොන්දේසි සපුරා ඇති විටකදිය. ප්‍රදානයන් ලැබීමේදි එය අදාල කාල පරිච්ඡේදයේදි ආදායමක් ලෙස සලකා එමගින් ආවරණය වන වියදම් සමඟ ගලපා ඇත. යම්කිසි ස්ථාවර වත්කමක් ලබා ගැනීම සඳහා අදාල වන පරිදි ලැබී ඇති ප්‍රදානයන් මත විලම්භීත ආදායම් ගණනය කෙරේ. මධ්‍යස්ථානයට මූල්‍ය නොවන ප්‍රදානයන් ලැබීමේදී සාධාරණ අගය මත ගණනය කරනු ලැබේ.

ප්‍රාග්ධන ප්‍රදානයන් භාවිතය ප්‍රධාන වර්ගීකරණ ද්විත්වයකට ගොනු කර ඇත. පලමුවෙන් වත්කම් අත්පත්කර ගැනීම් හා වත්කම් පුනරුත්ථාපනය කරලීම වැනි භෞතික පැවැත්මක් සහිත, ශේෂපත්‍රය තුළ නියෝජනය වන වත්කම් අත්පත්කර ගැනීම සඳහා භාවිතයන් හා ප්‍රාග්ධන අරමුදල් යොදවා ශේෂපත්‍ර අයිතමයන් නොවන, බලපෑම අවසානයේදී මෙහෙයුම් ප්‍රකාශනය තුළින් කපා හැරෙන ස්වරූපයේ භාවිතයන් වන මානව කුසලතා ඔප නැංවීම, දායකත්වය, ප්‍රචාරණ හා ප්‍රවර්ධන වියදම් හා පර්යේෂණ සංවර්ධන වියදම් භාවිතයන්ය. ඒ අනුව හිමිකම් ප්‍රකාශනයේ දක්වනු ලබන්නේ ශේෂපත්‍රය තුළ නියෝජනය වන වත්කම් අත්පත් කර ගැනීමට දරණ වියදම්ය.

ප්‍රවර්ථන වසර තුළදී රු.28,730,000.00වන ප්‍රාග්ධන ප්‍රධාන හා රු. 280,675,000.00 වන ප්‍රවර්ථන ප්‍රදානයන් භාණ්ඩාගාරයෙන් ලැබුනි. ප්‍රදානයන් ලැබීම් පිළිබඳ ඉතිහාසය සමග සටහන් පිටු අංක 125-127 හි දක්වා ඇත.

ප්‍රදානයන් මත වන අසම්භාව්‍ය වගකීම්

හිමිකම් ප්‍රකාශනයේ නියෝජනය වන රු.8,975,449.33 වන මෙතෙක් භාවිතයට නොගත් ප්‍රදානයන් තුළ, 2017 වර්ෂයේ සිට පැවතෙන රු. 1,530,000 ක් ඇත.එම මුදල මධ්‍යස්ථානය තුල තොරතුරු සැකසුම් පද්ධතියක් ස්ථාපිත කරලීම වෙනුවෙන් ලැබුනාවූද, එම තොරතුරු පද්ධතියේ ප්‍රධාන උප කොටස් වන HR module, Payroll module උපයෝජනය වීමෙන් පසුව, Accounting module එකට අදාල වන හා රදවාගත් මුදල්ය. සැපයුම්කරුහට Accounting module ය මෙතෙක් සාර්ථකව ස්ථාපනය කරලීමට හැකියාවක් නොලැබ ඇති බැවින් මෙම මුදල නැවත භාණ්ඩාගාරයට යැවීමේ හෝ ඔවුනගේ අවසරය පරිදි සමාන ස්වරූපයේ වෙනත් වත්කමක් අත්පත්කර ගැනීම සඳහා උපයෝගී කර ගැනීමේ අවදානම ඇත.

13. වියදම්, ආදායම් ප්‍රකාශනයන්හි ඉදිරිපත් කරලීම

ආදායම් ප්‍රකාශන වලදි ආදායමට අදාලව ජනනය වී ඇති වියදම සමඟ ගලපා ඇත. මධ්‍යස්ථානයේ එදිනෙදා කටයුතු පවත්වා ගෙන යාමේ වියදම්, ජංගම නොවන වත්කම් වලට සම්බන්ධ ක්ෂය වැනි ආදායමට එරෙහිව ගොඩනැගෙන්නා වූ වියදම් සලකනු ඇත.

14. පර්යේෂණ හා සංවර්ධන වියදම්

පර්යේෂණ හා සංවර්ධන වියදම් සඳහා ප්‍රමුඛතම මූල්‍යකරණය භාණ්ඩාගාරය මගින් ඉටු කෙරේ. පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතියක් යම් සේවාදායකයෙකු විසින් මූල්‍යකරණය තරනු ලබන විට එහි පිරිවැයට එරෙහිව ආදායමක් ලෙස සටහන් කරනු ඇත. පිරිවැය ලෙස සෘජු පිරිවැය පමණක් සලකනු ඇත.

15. මෙකට්‍රොනික්ස් තාක්ෂණයන් ආර්ථික සංවර්ධනය කිරීමේ මූලාරම්භයන්(MEDI)

ප්‍රමිතිගත පුහුණු කිරීම්, මූලාපෘති හා පරීක්ෂණ පහසුකම් ව්‍යාපෘතිය නර්ඩ මධ්‍යස්ථානය යටතේ ක්‍රියාත්මක වන අතර අවසානයේදී ශ්‍රී ලංකා රජය යටතේ ක්‍රියාත්මක වන ස්වාධීන ලාභ අරමුණු කර නොගත් ආයතනයක් බවට පරිවර්තනය කොට, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ඉලෙක්ට්‍රොනික, මෙකාට්‍රොනික සමාගම් හා එවැනි සමාගම් අතර තරග කිරීමට උත්සාහ දරණ තැනැත්තන් හට තම නිෂ්පාදන සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම පරීක්ෂා කිරීම හා සහතික කර ගැනීම් සේවාවන් නාමික මුදලක් අයකර සිදුකර දීමට බලාපොරොත්තුවේ.

මෙම ව්‍යාපෘතියේ මූලික පරමාර්ථය දේශීයව නිපදවන ලද අධි තාක්ෂණික නිශ්පාදන අපනයනය කිරීම තුළින් දල දේශීය නිෂ්පාදනය ඉහල නැංවීමයි. තවද දේශීයව අධි තාක්ෂණික නිෂ්පාදන නිෂ්පාදකයින් බිහි කිරීම හා බලපතුලාභී නිෂ්පාදන සඳහා අගය දාමයක් ඇති කිරීමද තවත් එක් පරමාර්ථයකි.

9.2 2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (රුපියල්)

විස්තරය	2021	2020 යලි සැකසූ
වත්කම්		
ජංගම වත්කම්		
මුදල් හා මුදල් සමාන දෑ	144,590,658.86	157,907,012.39
වෙළඳ ණය ගැතියෝ	13,745,632.78	7,254,932.16
තොග	12,615,896.85	12,832,182.07
කලින් ගෙවීම්	599,744.50	634,754.82
වෙනත් ජංගම වත්කම්	24,536,267.34	25,691,004.57
	196,088,200.33	204,319,886.01
ජංගම නොවන වත්කම්		
දේපල හා පිරියත		
කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ	424,238,974.24	458,974,164.25
අනෙකුත් අස්පෘශ්‍ය වත්කම්	-	5,452,215.80
වෙනත් ජංගම නොවන වත්කම්	404,319.45	390,029.45
	29,308,189.13	28,880,147.48
	453,951,482.82	493,696,556.98
මුළු වත්කම්	650,039,683.15	698,016,442.99
බැරකම්		
ජංගම බැරකම්		
වෙළඳ හා අනෙකුත් ගෙවියයුතු දෑ		
මුළු ජංගම බැරකම්	43,472,623.47	50,832,249.37
ජංගම නොවන බැරකම්	43,472,623.47	50,832,249.37
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්		
සුරක්ෂිත තැන්පතු	126,544,822.50	122,199,330.84
	6,200.00	6,200.00
මුළු බැරකම්	126,551,022.50	122,205,530.84
ශුද්ධ වත්කම්		
ශුද්ධ වත්කම්/ස්කන්ධය	170,023,645.97	173,037,780.21
විලම්බිත ආදායම්	**480,016,037.18**	**524,978,662.78**
රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන්	358,191,645.28	392,926,835.29
ප්‍රත්‍යාගනන සංචිතය	158,628,984.20	188,020,650.81
සමුච්චිත අතිරික්තය/(ඌනතාවය)		
	(36,804,592.30)	(55,968,823.32)
ශුද්ධ වත්කම්/ස්කන්ධය		
	480,016,037.18	**524,978,662.78**

ආචාර්ය ලීලානන්ද රාජපක්ෂ
සභාපති

කේ ආර් පද්මප්‍රිය
වැ.බ අධ්‍යක්ෂ ජනරාල්

ජේ එම් ආර් එස් ජයසිංහ
අධ්‍යක්ෂ මුදල්

9.3 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් වර්ගීකරණය කාර්ය පදනම මත විදහා පෑම

(මූල්‍ය ඒකකය - රුපියල්)

විස්තරය	2021	2020 යලි සැකසූ
<u>අයභාරය</u>		
අනෙකුත් රාජ්‍ය අස්තිත්වයන්ගෙන් හුවමාරු	296,345,345.09	276,993,402.55
විලම්භිත ආදායම්	76,792,936.82	73,535,856.06
අනෙකුත් අයභාරය	35,492,126.28	27,546,941.58
මුළු අයභාරය	408,630,408.19	378,076,200.19
<u>වියදම්</u>		
පරිපාලන පිරිවැය	290,286,777.23	318,263,514.21
අනෙකුත් වියදම්	22,339,215.12	14,678,176.19
ක්ෂය	76,792,936.82	73,528,335.56
මූල්‍ය වියදම	47,240.00	38,260.00
මුළු වියදම	389,466,169.17	406,508,285.96
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාවය)	19,164,239.02	(28,432,085.77)

9.4 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(මූල්‍ය ඒකකය - රුපියල්)

විග්‍රහය	2021	2020 යලි සැකසූ
මෙහෙයුම් මත ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	19,164,239.02	(28,432,085.77)
සාමන්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ අතිරික්තය/ඌනතාවය		
මුදල් නොවන වෙනස්වීම	76,792,936.82	73,528,335.56
ක්ෂයවීම්	(76,792,936.82)	(73,535,856.06)
විලම්භිත ආදායම්	313,171.36	-
අඩමාන ණය සඳහා වෙන් කිරීම්වල වැඩිවීම	(12,491,940.90)	8,004,983.04
ගෙවිය යුතු වියදම් වල වැඩිවීම/ අඩුවීම	9,477,806.66	11,054,511.84
සේවක පිරිවැය (වැඩිවීම/ අඩුවීම)	(11,377.50)	(187,800.00)
දේපල හා යන්ත්‍රෝපකරණ විකුණුම් (ලාභ/පාඩු)	977,991.12	4,569,324.26
අනෙකුත් ජංගම වත්කම් (වැඩිවීම/ අඩුවීම)	(6,803,879.98)	11,425,396.99
ලැබීම්වල (වැඩිවීම/ අඩුවීම)	10,626,009.78	6,426,809.86
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය		
ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		
පිරියත හා උපකරණ මිළට ගැනීම්	(37,013,395.72)	(19,311,622.10)
පිරියත හා උපකරණ විකුණුම්	11,377.50	187,800.00
ප්‍රාග්ධන ලැබීම් - අනෙකුත් ප්‍රභවයන්		99,900.00
ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	(37,002,018.22)	(19,023,922.10)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය	13,059,654.91	50,840,597.45
ප්‍රාග්ධන ලැබීම්	13,059,654.91	50,840,597.45
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	(13,316,353.53)	38,243,485.21
මුදල් හා මුදල් සමාන වත්කම් වල ශුද්ධ (වැඩිවීම/අඩුවීම)	157,907,012.39	119,663,527.18
කාලපරිච්ඡේදය අවසානයේ වූ මුදල් හා මුදල් සමාන දෑ	144,590,658.86	157,907,012.39

9.5 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/ ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

	ආරම්භක ප්‍රාග්ධනය	යලි සැකසූ රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන	භාණ්ඩාගාරයෙන් ලැබුනු මුදල් නොවන ප්‍රදානයන්	යලි සැකසූ රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන	යලි සැකසූ සමුච්චිත ලාභ/ අලාභය	මුළු ශුද්ධ ස්කන්ධය	2021.12.31 දිනට යලි සැකසූ ශේෂය
2020/01/01 දිනට ශේෂය 2020 වර්ෂයේ වත්කම් ස්කන්ධයේ වෙනස්කම්	1,000,000.00	4,500,000.56	148,553,634.87	452,191,906.28	(27,415,144.20)	578,830,397.51	615,191,450.66
ලද ප්‍රාග්ධන ප්‍රදානයන්-භාණ්ඩාගාරයෙන්							
ලද ප්‍රාග්ධන ප්‍රදානයන්		50,840,597.45				50,840,597.45	33,543,940.11
SPTF ශුද්ධ ප්‍රතිපලය ගැලපීම							
ස්ථිවර වත්කම් විකුණුම් මත විලම්භිත ආදායම්				(2,702,697.00)	(121,593.35)	(121,593.35) (2,702,697.00)	
විලම්භිත ආදායමට මාරු කල ප්‍රාග්ධන ප්‍රදාන		(16,973,482.07)		(56,562,373.99)		(73,535,856.06)	(64,656,358.72)
අනෙකුත් ප්‍රභවයන්ගෙන් ලද ප්‍රධානයන්			99,900.00			99,900.00	
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාවය)							
ප්‍රත්‍යාගනන සංචිත අතිරික්තය					(28,432,085.77)	(28,432,085.77))	(5,269,473.83)
2020.12.31 දිනට ශේෂය							20,839.29
2021 වර්ෂයේ ස්කන්ධයේ වෙනස්කම්	1,000,000.00	38,367,115.94	148,653,534.87	392,926,835.29	(55,968,823.32)	524,978,662.78	578,830,397.51
ලද ප්‍රාග්ධන ප්‍රදානයන් - භාණ්ඩාගාරයෙන්							
SPTF ශුද්ධ ප්‍රතිපලය ගැලපීම		13,059,654.91				13,059,654.91	50,840,597.45
ආදායම් වියදම් ශ්‍රේෂපත්‍ර මාරුවීම්							(121,593.35)
විලම්භිත ආදායමට මාරු කල ප්‍රාග්ධන ප්‍රදාන		(42,451,321.52)		(34,735,190.01)	8.00	8.00 (77,186,511.53)	(73,535,856.06)
පූර්ව වර්ෂ අත්පත්කර ගැනීම් වල ගැලපීම්							(2,702,697.00)
අනෙකුත් ප්‍රභවයන්ගෙන් ලද ප්‍රධානයන්							99,900.00
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාවය)							
2021.12.31 දින ඉදිරියට ගෙන ගිය ශේෂය					19,164,239.02	19,164,239.02	(28,434,085.77)
	1,000,000.00	8,975,449.33	148,653,534.87	358,191,645.28	(36,804,592.30)	480,016,037.18	524,978,662.78

9.6 පූර්ව වර්ෂ ගැලපීම

(අගය - රුපියල්)

අංකය යොමුව	විස්තරය	ගැලපුම් විස්තරය			2020	2020.01.01 දිනට පෙර ශේෂය	මූල්‍ය තත්ත්වයට බලපෑම
		විස්තර	ප්‍රකාශය	ගැලපීමෙන් පසු			
ශේෂය ඉ/ගෙ					(42,242,335.18)	(260,732,718.48)	
1.01	2020 වර්ෂයේදී අපහරණය කරන ලද වත්කම් වල ක්ෂය නිවැරදි කිරීම	සමුච්චිත ක්ෂය ආයුධ-වෙනත් මූලාශ්‍ර	7,520.54				වත්කම්වල ලියාභල අගය වැඩිවීම
		සමුච්චිත ක්ෂය-ලීබඩු		0.03			
		සමුච්චිත ක්ෂය-ආයුධ		0.01			
		පසුගිය වසරේ නිවැරදි කිරීම		7,520.54	7,520.50		
1.02	දිරි දීමනා වෙන්කිරීම නිවැරදි කිරීම	දිරි දීමනා සඳහා වෙන්කිරීම	11,220,184.38	10,388,206.38	831,978.00		ජංගම වගකීම් අඩුවීම
1.03	DPD/COM/34/19 නිම කරන ලද වැඩවල වටිනාකම පදනම්වූ ආදායම වැඩිවීම		4,374,906.03	4,389,875.29	14,969.26		ජංගම වත්කම් වැඩිවීම
1.04	E&ESD/COM/ACT/09/01/2020 වියදම් වැඩිවීම		6,699,490.20	7,888,030.20	1,188,540.00		ජංගම වගකීම් වැඩිවීම
1.05	රජයේ ප්‍රතිපාදන මත හෝ වෙනත් පාර්ශවයන්ගේ ප්‍රතිපාදන මත මිලදීගත් වත්කම් වල විලම්බිත ආදායම ඉහල දැමීම	සමුච්චිත ක්ෂය 2006 සිට 2020 ආරම්භක වර්ෂයේ සිට අවසන් වර්ෂය සඳහා පිලියම් සිදුකිරීම	931,859,376.24				විලම්බිත ආදායම වැඩිවීම
		සමුපූර්ණ සමුච්චිත ආදායම 2006 සිට 2020 දක්වා, ආරම්භක වර්ෂයේ සිට අවසන් වර්ෂය සඳහා පිළියම් සිදු කිරීම	694,572,869.38		5,094,832.12	232,191,674.74	
		ශුද්ධ බලපෑම	237,286,506.86				
1.06	2006 සිට අපහරනය කරන ලද වත්කම් වල වියදම, ආරම්භක වසරේ විලම්බිත ආදායම සඳහා පිළියම් සිදුකිරීම		28,495,782.49		6,949,824.99	21,545,957.50	
	2006 වර්ෂයේ සිට අපහරණය කරන ලද වත්කම් වල සමුච්චිත ක්ෂය , ආරම්භක වර්ෂයේ විලම්බිත ආදායම සඳහා පිලියම් සිදුකිරීම		(18,484,254.69)		(4,247,127.99)	(14,237,126.70)	
		ශුද්ධ බලපෑම	10,011,527.80		2,702,697.00	7,308,830.80	

1.07	CED/COM/73/2018 වියදම් අධි වෙන්කිරීම	ආදායම	7,709,040.81	7,709,040.81		11,104.19	ජංගම වගකීම් අඩුවීම
		වියදම	(7,315,471.32)	(7,304,367.13)			
		ශුද්ධ	393,569.49	404,673.68			
1.08	DPD/COM/37/2019 වියදම් අධි වෙන්කිරීම	ආදායම	1,487,000.00	1,487,000.00		19,075.74	ජංගම වගකීම් අඩුවීම
		වියදම	(1,283,648.78)	(1,264,573.04)			
		ශුද්ධ	203,351.22	222,426.96			
1.09	DPD/COM/ACT/07/47/2019 වියදම් අධි වෙන්කිරීම	ආදායම	305,000.00	305,000.00	19,643.50		ජංගම වගකීම් අඩුවීම
		වියදම	(192,648.71)	(173,005.21)			
		ශුද්ධ	112,351.29	131,994.79			
1.10	APHT/COM/99/17 වියදම් අධි වෙන්කිරීම	ආදායම	2.229.184.01	2.229.184.01		94,492.59	ජංගම වගකීම් අඩුවීම
		වියදම	(1,890,741.49)	(1,796,248.90)			
		ශුද්ධ	338,442.52	432,935.11			
1.11	DPD/COM/35/19 සඳහා අමතර වැඩ හදුනා ගැනීම	ආදායම	13,600,000.00	13,637,836.94		37,836.94	ජංගම වත්කම් අඩුවීම
		වියදම	10,906,944.87	10,906,944.87			
		ශුද්ධ	2,693,055.13	2,730,892.07			
1.12	**DPD/COM/35/19 සඳහා ලැබිය යුතු රදවා ගත් මුදල් හදුනා ගැනීම**	ආදායම	**13,600,000.00**	**13,877,575.00**		**277,575.00**	ජංගම වත්කම් වැඩිවීම
		වියදම	**10,906,944.87**	**10,906,944.87**			
		ශුද්ධ	**2,693,055.13**	**2,970,630.13**			
1.13	DPD/COM/46/19 **සඳහා අමතර වැඩ හදුනා ගැනීම**	ආදායම	8,169,431.59	8,222,434.74		53,003.15	ජංගම වත්කම් වැඩිවීම
		වියදම	6,259,043.65	6,259,043.65			
		ශුද්ධ	1,910,387.94	1,963,391.09			
1.14	රජයේ විගණකාධිපතිවරුන් සඳහා විගනන ගාස්තු ඌන වෙන්කිරීම ගැලපීම	වියදම	275,400.00	306,000.00			ජංගම වගකීම් වැඩිවීම
			27,5400.00	306,000.00	**(30,600.00)**		
1.15	අලෙවිකරණ ආදායම	ආදායම		3,150.00	**3,150.00**		ජංගම වත්කම් වැඩිවීම

1.16	DPD/COM/48/19 හි වියදම් වැඩිවීම	ආදායම	300,000.00	300,000.00			ජංගම වගකීම් වැඩිවීම
		වියදම	75,601.37	113,700.51			
		ශුද්ධ	224,398.63	186,299.49	**(38,099.14)**		
1.17	DPD/COM/52/20 සඳහා වියදම් වැඩිවීම	ආදායම	432,000.00	432,000.00			ජංගම වගකීම් වැඩිවීම
		වියදම	344,160.00	354,014.00			
		ශුද්ධ	87,840.00	7,986.00	**(9,854.00)**		
1.18	වාද්දුව - 1 යෝජිත සායනික ගොඩනැගිල්ල සඳහා උපදේශන සේවා සැපයීම වෙනුවෙන් වියදම වැඩිවීම	ආදායම	5,110,589.00	5,110,589.00			ජංගම වගකීම් වැඩිවීම
		වියදම	1,385,280.95	1,992,319.23			
		ශුද්ධ	3,725,308.05	3,118,269.77	**(607,038.28)**		
1.19	ආරම්භක රෝනියෝ තොගය ඉහල යාම				**336,721.58**		ජංගම වත්කම් වැඩිවීම
	එකතුව				**(32,727,874.64)**	**(20,739,125.33)**	

9.7 2021.12.31 දිනට ගිණුම්කරණ සටහන්

2. සුරක්ෂිතයන් ලෙස තබන ලද ඇප තැන්පතු

රුපියල්

ඇපකරය නිකුත් කරන ලද්දේ	ඇප අංකය/දිනය	ඉකුත්වන දිනය	බැඳුම්කරය	සුරක්ෂිත ලෙස තබා ඇති සහතිකය	සුරක්ෂිතයෙහි වටිනාකම	බැංකුව	ඇප අගය
ටොයෝටා ලංකා පුද්ගලික සමාගම	15/2008 12/18/2020-12/17/2021	12/17/2022	ඇප තැන්පතු බැඳුම්කරය	C/33734579-507908	100,000.00		75.000.00
කාර්මික තාක්ෂණික ආයතනය	11/02/2021-03/31/2022	03/31/2022	කාර්ය සාධන බැඳුම්කරය	1711258-86324444	100,000.00		34,500.00
මිල්කෝ පුද්ගලික සමාගම	20200003940 12/16/2020-07/15/2021	7/15/2021	අත්තිකාරම් සුරකුම් පත්	1711283-86598161 1711284-86598169	3,000,000.00 1,500,000.00	ලංකා බැංකුව - ජා ඇල	4,346,332.16
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය කොළඹ විශ්ව විද්‍යාලය	20210003979- 12/22/2021-11/06/2022	11/06/2021	අත්තිකාරම් සුරකුම් පත්	1804804-87961092 1804805-87961119	5,000,000.00 5,000,000.00		8,558,410.00
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය කොළඹ විශ්ව විද්‍යාලය	20210003978 12/22/2021-11/06/2022	11/06/2021	කාර්ය සාධන බැඳුම්කරය	1804809-8808829	3,000,000.00		2,379,412.75

3. ස්ථාවර වත්කම් ඉවත්කරලීම

අගය (රු.)

වත්කම් වර්ගය	ලියාහල අගය	විලම්බිත අයභාරය	විකුණුම් මිල	ලාභය/අලාභය
ලීබඩු හා සවිකිරීම්	19,158.49	19,158.49	1,942.50	1,942.50
කාර්යාල උපකරණ	140,733.85	140,733.85	3,663.00	3,663.00
ප්‍රදර්ශන භාණ්ඩ	4,742.19	4,742.19	-	-
පිරියත හා යන්ත්‍ර	499.18	499.18	11.10	11.10
ආයුධ	136,091.61	136,091.61	1,925.85	1,925.85
පරිගණක	12.00	12.00	-	-
උපකරණ	92,337.39	92,337.39	3,835.05	3,835.05
මුලු අගය	393,574.71	393,574.71	11,377.50	11,377.50

04. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

මධ්‍යස්ථානය 2020 වර්ෂය තුලදී VAT සඳහා ලියාපදිංචි නොකල ආයතනයක් ලෙස සලකන ලද අතර 2021 වර්ෂය තුළදී නැවත එම ලියාපදිංචිය ලබා ගන්නා ලදී.

05. තාවකාලික තැන්පතු

ශිෂ්‍යත්වයනට විදේශගත වීමේදී මධ්‍යස්ථානය සමග බැඳුම්කරනයට එළඹියාවූද, ඒවා නිසි ලෙස සපුරාලීමට නොහැකියාවූද සේවකයන්ගෙන් අයකර ගන්නා ලද වූද දණ්ඩනයන් හා ඒවා State Institute Surplus Trust Fund හි ආයෝජනය කරලීමෙන් ලද රු. 7,011,594.73 ක් වූ පොලිය 2020 වර්ෂය තුලදී රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කර ගන්නා ලදී. මෙම ගණුදෙනුව 2021 ගිණුම් වර්ෂයේදී පූර්ව වර්ෂ ගැලපීමක් ලෙස ගිණුම් වල යලි සකසන ලදී.

මීට අමතරව 2021 වර්ෂයේ ගිණුම් තුල පූර්ව වර්ෂ ගැලපීම් සිදුකර නැවත ඉදිරිපත් කර ඇත.

තවද ගණුදෙනුකරුවන්ගෙන් ලැබෙන අත්තිකාරම් මුදල් අදාළ කාරණාව සඳහා යොදා ගන්නා තෙක් බැංකුවේ තාවකාලික තැන්පතු වල සුරක්ෂිතව තබනු ලැබේ. එමගින් ලැබෙන් පොළී ආදායම අනෙකුත් ආදායම් යටතේ දක්වා ඇත.

06. කෙරීගෙන යන වැඩ

කෙරීගෙන යන වැඩ ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙස දක්වා ඇත. ප්‍රාග්ධන කෙරීගෙන යන වැඩ ශේෂ පත්‍රය තුළ වෙනම අයිතමයක් ලෙස පෙන්වා ඇත.

2021ට අදාල ප්‍රාග්ධන කටයුතු 2022 වර්ෂයට ගෙන යාමට නොහැක යන භාණ්ඩාගාර ප්‍රතිපත්තිය මත සියලුම ප්‍රාග්ධන අයිතමයන්ගේ වැඩ සම්පූර්ණ කර 2021 වසර තුලදීම ප්‍රාග්ධනිත කර ඇත.

07. සම්බන්ධිත පාර්ශවයන් අනාවරණය - SLPSAS 14

2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාවන්හි පහත දැක්වෙන අනාවරනයන් කරනු ඇත. මෙම මූල්‍ය කාලපරිච්ඡේදය සඳහා මධ්‍යස්ථානයෙහි ප්‍රධාන කළමණාකාරිත්වය හා බැදුනු කිසිදු පාර්ශවයකට යම් ගෙවීමක් කර නොමැත.

08. (a) ප්‍රමිතිගත පුහුණු කිරීම්, මූලාකෘති හා පරීක්ෂණ පහසුකම්

ව්‍යාපෘතිය නර්ඩ මධ්‍යස්ථානය යටතේ ක්‍රියාත්මක වන අතර අවසානයේදී ශ්‍රී ලංකා රජය යටතේ ක්‍රියාත්මක වන ස්වාධීන ලාභ අරමුණු කර නොගත් ආයතනයක් බවට පරිවර්තනය කොට, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ඉලෙක්ට්‍රොනික, මෙකාට්‍රොනික සමාගම් හා එවැනි සමාගම් අතර තරග කිරීමට උත්සාහ දරණ තැනැත්තන් හට තම නිෂ්පාදන සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම මූලාකෘති සැකසුම් පරීක්ෂා කිරීම හා සහතික කර ගැනීම් සේවාවන් නාමික මුදලක් අයකර සිදුකර දීමට බලාපොරොත්තුවේ.

මෙම ව්‍යාපෘතියේ මූලික පරමාර්ථය දේශීයව නිපදවන ලද අධි තාක්ෂණික නිෂ්පාදන අපනයනය කිරීම තුළින් දල දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීමයි. තවද දේශීයව අධි තාක්ෂණික නිෂ්පාදන නිෂ්පාදකයින් බිහි කිරීම හා බලපත්‍රලාභී නිෂ්පාදන සඳහා අගය දාමයක් ඇති කිරීමද තවත් එක් පරමාර්ථයකි.

(b) ඉදිරියට ගෙන නොයන

මෙම කටයුත්ත මේ වනවිට සමාප්ත කරලීම සඳහා අමාත්‍යාංශය විසින් කටයුතු කරමින් පවතී.

09. අනතුරු, හානිවීම් සහ අයකර ගැනීම්

KR 5435 දරණ මෝටර් රථය 2021 වර්ෂය තුලදී අනතුරකට බදුන්වූ අතර, ඒ සඳහා රක්ෂණ ආයතනය විසින් ගෙවීමට එකග මුදල සටහන් අංක 06 යටතේ දක්වා ඇත.

10. සන්සන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කරලීමේදී සිදුවූ වෙනස්කම්

වියදම් වර්ගීකරණයේ ප්‍රශස්තභාවය සඳහා, දුරකථන බිල් ප්‍රතිපූර්ණය කරලීම අනෙකුත් මෙහෙයුම් වියදම් වලින් ඉවත් කර පෞද්ගලික වියදම් යටතේ දක්වා ඇත.

2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සටහන්

(අගය - රුපියල්)

විග්‍රහය	2021	2020(යලි සැකසූ)
මෙහෙයුම් මත ක්‍රියාකාරකම් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		
<u>ලැබීම්</u>		
ව්‍යාපෘති අදායම	69,803,517.48	60,660,779.48
ප්‍රවර්තන හා පර්යේෂණ ලැබීම්	296,345,345.09	276,993,402.55
පොලිය ලැබීම්	6,481,305.93	5,974,642.01
අනෙකුත් ලැබීම්	1,234,379.70	678,138.71
<u>ගෙවීම්</u>		
සේවක පිරිවැය	(234,834,403.32)	(249,746,388.25)
විශ්‍රාම වැටුප්	(15,682,081.66)	(26,296,060.48)
සැපයුම්	(87,448,936.39)	(33,281,472.13)
අනෙකුත් ගෙවීම්	(23,586,245.04)	(28,128,247.15)
බදු	(1,686,872.01)	(427,984.88)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය	10,626,009.78	6,426,809.86
ආයෝජන මගින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		
වත්කම් මිළට ගැනීම්		(19,311,622.10)
උපකරණ විකුණුම්	(37,013,395.72)	187,800.00
අනෙකුත් ප්‍රභවයන්ගෙන් ලද ප්‍රාග්ධන වත්කම්	11,377.50	99,900.00
ආයෝජන මගින් ඉපැයූ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	(37,002,018.22)	(19,023,922.10)
මූල්‍ය කටයුතු වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
ප්‍රාග්ධන ලැබීම්	13,059,654.91	50,840,597.45
මූල්‍ය කටයුතු වලින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	13,059,654.91	50,840,597.45
මුදල් හා සමාන වත්කම් වල (වැඩිවීම්/අඩුවීම්)	(13,316,353.53)	38,243,485.21
කාලපරිච්ඡේදය ආරම්භයේ වූ මුදල් හා මුදල් සමාන දෑ	157,907,012.39	119,663,527.18
කාලපරිච්ඡේදය අවසානයේ වූ මුදල් හා මුදල් සමාන දෑ	<u>144,590,658.86</u>	<u>157,907,012.39</u>



10.

2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } අයිඑම්වී/සි/එන්ආර්සීසී/එෆ්ඒ/2021 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2022 ජූලි 27 දින

සභාපති,

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය නිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල. ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මධ්‍යස්ථානයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මධ්‍යස්ථානයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මධ්‍යස්ථානයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් , ව්‍යාජලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතාකරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයනලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයනලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර,

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මධ්‍යස්ථානය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මධ්‍යස්ථානය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර මධ්‍යස්ථානයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

මධ්‍යස්ථානයේ 2021 වර්ෂය සඳහා පරිගණක මිලදී ගැනීමට රු.4,522,370 ක මුදලක් වැය කර තිබුණි. මධ්‍යස්ථානයේ ප්‍රාථමික මට්ටමේ සේවකයින් හැරුණු විට දැනට සිටින නිලධාරී සංඛ්‍යාව 143 ක් වුවත් ආයතනය සතු මුළු පරිගණක (Desktop, Laptop, Notebook, Tablet) 240 ක් විය. ඒ අනුව පරිගණක අවශ්‍ය නිලධාරීන් සංඛ්‍යාව ඉක්මවා පරිගණක යන්ත්‍ර 97 ක් නිෂ්කාර්යව මිලටගෙන ඇති බව නිරීක්ෂණය විය.

2.3 අනෙකුත් කරුණු

(අ) පසුගිය වර්ෂය අවසානයට තිබුණු වෙළඳ හා ලැබිය යුතු දෑ ශේෂය රු.7,254,932 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එම ශේෂය රු.13,745,632 ක් දක්වා වර්ධනය වී තිබුණි. ණය අයකර ගැනීමේ අකාර්යක්ෂමතාවය හේතුවෙන් පසුගිය වර්ෂයට සාපේක්ෂව ලැබිය යුතු ශේෂ සියයට 89 කින් ඉහළ ගොස් තිබුණි. එසේම මධ්‍යස්ථානයට 2021දෙසැම්බර්

31 දිනට ආයතන 5 කින් පමණක් ලැබිය යුතු රු. 2,346,964 ක මුදලින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂයේදී ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 18 ක් තෘතීයික මට්ටමේ තනතුරු 05 ක් ද්විතීයික මට්ටමේ තනතුරු 06 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 48 ක් විගණිත දිනය වූ 2022 මැයි 25 දින වන විට පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය.

ඩබ්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති



11.

2021 විගණකාධිපති වාර්තාවේ දක්වා ඇති කරුණු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල පැහැදිලි කිරීම්

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2021 වර්ෂයේ විගණන වාර්තාවේ මතුකර ඇති ගැටළු නිවැරදි කිරීම පිණිස ගනු ලැබූ ක්‍රියාමාර්ග පහත දක්වා ඇත.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය අනුව මධ්‍යස්ථානයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුල අදාල නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

මධ්‍යස්ථානයේ 2021 වර්ෂය සඳහා පරිගණක මිලදී ගැනීමට රු. 4,522,370 ක මුදලක් වැය කර තිබුණි. මධ්‍යස්ථානයේ ප්‍රාථමික මට්ටමේ සේවකයින් හැරුණු විට දැනට සිටින නිලධාරි සංඛ්‍යාව 143 ක් වුවත් ආයතනය සතු මුළු පරිගණක (Desktop, Laptop, Notebook, Tablet) 240 ක් විය. ඒ අනුව පරිගණක අවශ්‍ය නිලධාරීන් සංඛ්‍යාව ඉක්මවා පරිගණක යන්ත්‍ර 97 ක් නිෂ්කාර්යව මිලටගෙන ඇති බව නිරීක්ෂණය විය.

දැනට ආයතනය තුල පරිගණක 240 ක් ඇත. එය බෙදී ඇති ආකාරය පහත පරිදි වේ.

උසස් කළමනාකාරීත්වය, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ කළමනාකරණ සහකාර යන කාණ්ඩ 26ක් අතරට ඩෙස්ක්ටොප් එකක් සහ ලැප්ටොප් එකක් ඇතුළත් පරිගණක අංක දෙක බැගින් බෙදා හැර ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස මුළු පරිගණක 52ක් නිර්මාණය වී ඇත. ඒවා විශේෂයෙන් 'නිවසේ සිට වැඩ' ක්‍රියාකාරකම් භාවිතා කරන ලදී. අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයින් 117 දෙනෙකු අතර තවත් පරිගණක අංක 117ක් (ඩෙස්ක්ටොප් සහ ලැප්ටොප්) බෙදා හැර ඇත. (ආදාළ මුළු කාර්ය මණ්ඩලය 143 කි.)

ඉතිරි පරිගණක පහත සඳහන් පරිදි වෙන් කර ඇත.

පරීක්ෂණාගාර, කෞතුකාගාර, පුස්තකාලය, බැහැරසේවා හා උපකරණ, නිර්මාණාත්මක සහ පොදු ස්ථාන සඳහා 40, සර්වර් පරිගණක 10, හදිසි ප්‍රතිස්ථාපන සඳහා 3, භාවිතයට නුසුදුසු ලෙස හඳුනාගත් සංඛ්‍යාව 18, සියල්ල 240යි.

2021 වර්ෂය සඳහා පහත සඳහන් පරිදි නව පරිගණක සහ අනෙකුත් පරිගණක උපාංග මිල දී ගැනීම සඳහා රු.4,522,370 මුදලක් පරිගණක, මුද්‍රණ යන්ත්‍ර නව අවශ්‍යතා මෙන්ම, අවශ්‍ය අනෙකුත් පරිගණක උපාංග සඳහා වියදම් කර ඇත. පරිගණක මිල දී ගෙන ඇත්තේ භාවිතයට නුසුදුසු පරිගණක සඳහා ප්‍රතිස්ථාපන වශයෙනුත් WFH සංකල්පය යටතේ නිවසේ සිට වැඩ කිරීමට අවශ්‍ය පරිගණක ලබා දීම සඳහාත්ය.

ඒ අනුව, පරිගණක අවශ්‍ය නිලධාරීන් සංඛ්‍යාව ඉක්මවා පරිගණක යන්ත්‍ර 97 ක් නිෂ්කාර්යව මිලටගෙන ඇති බව සඳහන් කිරීම නිවැරදි නොවේ.

2.3 අනෙකුත් විස්තර (තොරතුරු)

(අ) පසුගිය වර්ෂය අවසානයට තිබුණු වෙළඳ හා ලැබිය යුතු දෑ ශේෂය රු. 7,254,932 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එම ශේෂය රු. 13,745,632 ක් දක්වා වර්ධනය වී තිබුණි. ණය අයකර ගැනීමේ අකාර්යක්ෂමතාවය හේතුවෙන් පසුගිය වර්ෂයට සාපේක්ෂව ලැබිය යුතු ශේෂ සියයට 89 කින් ඉහල ගොස් තිබුණි. එසේම මධ්‍යස්ථානයට 2021 දෙසැම්බර් 31 දිනට ආයතන 5 කින් පමණක් ලැබිය යුතු රු. 2,346,964ක් මුදලින් කිසිදු මුදලක සමාලෝචිත වර්ෂයේදී ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

මෙම රු.13,745,632.78 ක අගය Value of Work Done පදනම මත, සම්පූර්ණ කරන ලද වැඩ ප්‍රතිශතය මත වර්ෂයට නියමිත ආදායම් හඳුනාගැනීම සඳහා කරන ලද සටහන් වලින් 2021.12.31 දිනට පියවීම් අඩු කල පසු ඉතිරි ශේෂයන්ය.

2022 වර්ෂයේ පියවීම් හා වැඩ අවසන් වීම මත Mobilization අත්තිකාරම් මුදල හිලව් වීමෙන් මේ වන විට පියවීම් රු.4,136,542.50, දෝෂ වගකීම් කාලය ඉක්ම නොයෑම මත ලබා ගැනීම සඳහා තව දුරටත් කාලය පවතින රැඳවුම් මුදල් රු.1,401,191.31, එම අගය දෝෂ වගකීම් කාලය ඉක්ම යෑමෙන් පසුව අය කර ගැනීමට කටයුතු කරනු ඇත. තවද, කරන ලද වැඩ ප්‍රතිශතයට අනුව Value of Work Done පදනමෙන් ආදායම් හඳුනාගෙන තිබුනද ගිවිසුම ප්‍රකාරව ඊලග පියවරයන් (Slabs) සම්පූර්ණ වීමෙන් පමණක් ඉල්ලා සිටිය හැකි අගයන් රු.618,853.05. තවද, Measure & pay පදනම මත මුල් තක්සේරු කරන ලද වැඩ ප්‍රමාණය වෙනස්වීම මත හා VAT අනුපාත වෙනස් වීම මත, ගණුදෙනු නිශ්චිත වීමෙන් අනතුරුව ආපසු පොත් වලින් ගැලපීමට ඉඩ ඇති අගයන් රු.1,120,353.72, ඒ අනුව එම අගය නැවත පොත් වලට ගැලපීමක් කිරීමට අපේක්ෂා කරනු ඇත. තවද, ලබා ගැනීම සඳහා මේ වන විට ණයගැතියන් හා සම්බන්ධ වෙමින් කටයුතු කරමින් යන අගය රු.6,468,692.20 කි.

(ආ) **මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 18 ක් තෘතීයික මට්ටමේ තනතුරු 05 ක් ද්විතීයික මට්ටමේ තනතුරු 06 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 48 ක් විගණිත දිනය වූ 2022 මැයි 25 දින වන විට පුරප්පාඩු පවතින බව නිරීක්ෂණය විය.**

රාජ්‍ය ආයතනය තුළ බඳවා ගැනීම් සීමා කිරීම් සම්බන්ධයෙන් මෑතකාලීනව නිකුත් වී ඇති පහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණ සහ චක්‍රලේඛ හේතුවෙන් පසුගිය වකවානුවේ ආයතනයේ පැවති පුරප්පාඩු සඳහා බඳවාගැනීම් සිදු කිරීමට නොහැකි විය. (මේ සම්බන්ධයෙන් එවකට පැවති අමාත්‍යාංශය වන නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් වරින් වර අප වෙත දැනුම් දී ඇත.)

- 2020.02.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක1/2020 අනුව රාජ්‍ය ආයතනයන්හී ප්‍රාථමික සේවා ගණයේ (PL-1, PL-2, PL-3) පුරප්පාඩු සඳහා බඳවාගැනීම් අත්හිටුවීම.
- රාජ්‍ය වියදම් සමාලෝචනය සම්බන්ධ 21/1596/304/134 හා 2021.08.31 අමාත්‍ය මණ්ඩල තීරණය "විවක්ෂණශීලීව රාජ්‍ය වියදම් කළමනාකරණය" යන මැයෙන් වූ අමප/22/0178/304/014 හා 2022.02.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය.
- "රාජ්‍ය වියදම් පාලනය කිරීම" යන මැයෙන් වූ 2022.04.26 වැනි දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022.

මීට අමතරව ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විද්‍යාර්ථී (HM 2-3) තනතුර අනුමත බඳවාගැනීමේ පරිපාටියට අනුව අභ්‍යන්තරිකව බඳවාගැනීම් සිදුකිරීමට නියමිත තනතුරක් හෙයින් අදාල සුදුසුකම් සම්පූර්ණකර ඇති නිලධාරියෙකු නොසිටීම මත බඳවාගැනීම් සිදුකර නොමැත.